# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 ඔක්තෝබර් 09 වන අඟහරුවාදා**
2012 ஒக்டோபர் 09 செவ்வாய்க்கிழமை
Tuesday 09th October 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 10.00 පළාත් සභාව රැස් විය.**
*மு.ப.10.00 க்கு சபை கூடியது*
*The Provincial Council met at 10.00 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2012.10.10 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that copies of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වැල්ලම්පිටිය, කොලොන්නාව පාර, අංක 78 A හි පදිංචි එම්.ඒ. ශ්‍රියාකාන්ති යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, අතුර බුලත්සිංහල, රෝහල අසල පදිංචි එච්. ඉන්දු වසන්තා දමයන්ති යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, දොඩන්ගොඩ, මාහගොඩ හි පදිංචි මද්දුමාගේ රේණුකා තිලන්ති යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## පයාගල ස්කාගාර සමුපකාර සමිතිය
DISTILLERIES' COOPERATIVE SOCIETY OF PAYAGALA

**01.**

**ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂයය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(01)12/21)**

අ. පයාගල ස්කාගාර සමූපකාර සමිතිය වර්තමානයේ පාලනය වන්නේ සමූපකාර කොමසාරිස්තුමා පත් කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන්ද, එසේත් නැත්නම් සමූපකාර සාමාජිකයින්ගෙන් පත් කළ අධ්‍යක්‍ෂ මණ්ඩලයකින්ද?

ආ. එහි සභාපතිවරයා කවුරුන්ද?

ඇ. මෙම සමූපකාර සමිතියට "රා" සපයනු ලබන සැපයුම්කරුවන් කවුරුන්ද?

ඈ. එම සැපයුම්කරුවන් ගණන කීයද?

ඉ. ඔවුන්ගේ නම් සහ ලිපිනයන් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඊ. මසකට "රා" ලීටර කොපමණ ප්‍රමාණයන් සමිතියට ලැබෙන්නේද?

උ. "රා" ලීටරයකට ගෙවනු ලබන මුදල කොපමණද?

උෟ. ලැබෙන "රා" වලින් ස්ප්‍රීතු හෝ අරක්කු කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නේද?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අා. සමුපකාර කොමසාරිස් විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයකිනි.

ආ. එන්.එච්. රුවන් අමරදේව මහතා (සමුපකාර සංවර්ධන නිලධාරී)

ඇ. සාමාජිකයින් හා සාමාජික නොවන අය.

ඈ. 1. සාමාජිකයින් 22
2. සාමාජිකයින් නොවන 22

ඉ. සාමාජික රා සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය :

| නම | ලිපිනය |
|---|---|
| නිරෝෂා ගීතානි මිය | දකුණ පයාගල, පයාගල. |
| එච්. රුජීව සිල්වා මයා | කටුකුරුන්ද, කළුතර. |
| ගීතානි වික්‍රමආරච්චි මිය | 122, මහගම්මැද්ද, පයාගල. |
| පද්මා ද සිල්වා මිය | පහලගොඩ, පයාගල. |
| ජී. ඇනී සිල්වා මිය | නව මාවත, කුඩා පයාගල. |
| එරික් ඇනස්ලි ප්‍රනාන්දු මයා | අළුත්පල්ලිය පිටුපස, කලමුල්ල. |
| පී.ටී.පී. අබේගුණවර්ධන මයා | පහලගොඩ, පයාගල. |
| පාතිමා සිද්දිකා මිය | නිර්මලවත්ත, මග්ගොන. |
| බන්දුසිරි පෙරේරා මයා | ගුවන්තොටුපල පාර, ඇතගම, පයාගල. |
| ජී. අජිත් වසන්ත මයා | මහගම්මැද්ද, පයාගල. |
| කේ. ශිරාන් ධම්මික මයා | ගෝමරකන්ද, පොතුවිල, පයාගල. |
| ජේ.එච්. පුන්‍යසිරි සිල්වා මයා | 10 බී, සහන් සෙවරණ, ඇතගම, කළුතර, |
| කේ. මාලා කුමුදුණී මිය | ලිස්බන් පෙදෙස, දළුවත්ත, පයාගල. |
| ශිරෝමනී දිල්ශ්‍රියා කුරේ මිය | අළුත්පල්ලිය පිටුපස, කලමුල්ල. |
| ජී. ප්‍රින්සි මාලනී මිය | ජෝසප් සෝවිස් මාවත, කුඩා පයාගල. |
| නිහාල් රාජකරුණා මයා | නාගහදූව, පයාගල. |
| බී. ක්‍රිසා සරෝජනී චාවි මිය | ජෝසප් සෝවිස් මාවත, කුඩා පයාගල. |
| උපාලි බන්දුරත්න මයා | පහලගොඩ, පයාගල. |
| ජී. අනුරජිත් මයා | දියලගොඩ, මග්ගොන. |
| ජී. රන්ජනී ප්‍රනාන්දු මිය | ජෝසප් සෝවිස් මාවත, කුඩා පයාගල. |
| ප්‍රියානි මැක්ෂිමාරි මිය | කන්‍යාරාමය පිටුපස, කලමුල්ල, කළුතර. |
| ඩී. ගර්ලි පරණගම මිය | ප්‍රසේවාස් පිය පෙදෙස, කලමුල්ල, කළුතර |

සාමාජික නොවන රා සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය :

| නම | ලිපිනය |
|---|---|
| එච්. ස්ටැන්ලි නෝනිස් මයා | වැල්ලබඩ, උතුර පයාගල. |
| ජී. අනුර සුමිත් මයා | අළුත්පල්ලිය පිටුපස, කලමුල්ල. |
| ඩබ්.ඒ.ඩී. අජන්ත මහේෂ් මයා | ධීවර නිවාස, කලමුල්ල, කළුතර. |
| කොල්වින් හියුබට් මයා | පහලගොඩ, පයාගල. |
| එච්. චරක ප්‍රනාන්දු මයා | කන්‍යාරාමය පාර, කලමුල්ල, කළුතර. |
| පියසේන මැදෝන්සා මයා | සුමනාරාම මැද පාර, ඇතගම. |
| නිලූකා සංජීවනී මිය | 25, නූර්ඩීන් පාර, කටුකුරුන්ද, කළුතර. |
| නිමීරා මධුෂානි මෙය | දේවගොඩ, පයාගල. |
| තමරා කාන්ති සිල්වා මිය | කටුකුරුන්දගහලන්ද, පයාගල. |
| මෙරිල් බර්නාඩ් ෆොන්සේකා මයා | 309, පුෂ්පාරාම පාර, විලේගොඩ, කළුතර. |
| සුදේශ්වරී එරන්දිකා මිය | පළමු පටුමග, කලමුල්ල, කළුතර. |
| ජේ. මිලන්ති කුමාරි මිය | කළුදූව, නාලගහදූව, පයාගල. |
| එච්. සංජය සිල්වා මයා | ඇටවිලවත්ත, කළුතර. |
| ක්‍රිෂාන්ත රෝහන මයා | කළුවාමෝදර, අළුත්ගම. |
| සුනෙත් සමීර ද සිල්වා මයා | කළුවාමෝදර, අළුත්ගම. |
| සමන් විජිත කුමාර මයා | විමල් විල, සිරිපති පාර, අළුත්ගම. |
| සුදත් කුමාර ද සිල්වා මයා | 1/199, ගම්මැද්ද, කළුවාමෝදර, අළුත්ගම. |
| සුමල්කා චාන්දනී ද සිල්වා මිය | වෙලේ පන්සල පාර, කළුවාමෝදර, අළුත්ගම. |
| නාලනී කුසුමාවතී සිල්වා මිය | වෙලේ පන්සල පාර, කළුවාමෝදර, අළුත්ගම. |
| බී.වී.ඩී.කේ. දිසානායක මයා | සිරිපති පාර, කළුවාමෝදර, අළුත්ගම. |
| ඩී. දිලූෂා මානෙල් ද සිල්වා මිය | හෙට්ටිමුල්ල, කළුවාමෝදර, අළුත්ගම. |
| මනෝජා කාන්ති සිල්වා මිය | කළුවාමෝදර, අළුත්ගම. |

ඊ. සාමාන්‍ය වශයෙන් ලීටර් 129517 ක් පමණ.

උ. රුපියල් 25/-

ඌ. 2012 මාර්තු සිට සැප්තැම්බර් දක්වා ස්ප්‍රීතු ලීටර් 82002 ක ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇත.

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳ පොඩි ප්‍රකාශයක් කරන්න අවසර ලබා දෙන්න. මේ ස්කාගාරය වහලා තිබුණා. මේකේ සාමාජිකයන්ගේ පෙත්සමක් අනුව ගරු ප්‍රධාන ඇමැතිතුමා වග කිවයුතු සියලු දෙනා පසුව කැඳවලා අපි ටෙන්ඩරයක් කැඳවලා,

අවශ්‍ය කටයුතු කරන්න පටන් ගත්තා. අවුරුදු ගණනක් වහලා තිබුණු නිසා මේ බොයිලර්ස් ඔක්කෝම බිමට කඩා වැටිලා තිබුණේ. අද ඒ ගම්වල රා මදින මිනිස්සුන්ට නැවත මේ රා ටික දීලා මේ ආයතන අපට දියුණු කරන්න පුළුවන්කමක් ලැබුණා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මේ සමූපකාර ප්‍රශ්නයත් එක්ක මටත් 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මමත් සමූපකාරයේ සාමාජිකයෙක් හැටියට, මීරිගම සමූපකාරය දැන් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔව් ගරු සභාපතිතුමනි. මම මීරිගම සමූපකාරයේ සාමාජිකයෙක් හැටියට මාස තුනකට ප්‍රථම මීරිගම සමූපකාරයේ නිලවරණය පැවැත් වූවා. සමූපකාර ඡන්දය. දැන් එහි මහ සභාව, අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා ගැනීමට කාලය ඇවිල්ලා තිබෙනවා. එහෙත් දැන් හිටපු සභාපතිතුමාගේම ගෝලයෙක් විසින් තහනම් නියෝගයක් පනවාගෙන තිබෙනවා. විශේෂයෙන්ම මෙහි අයථා පාලනයක් වන නිසා සමූපකාරයේ ඡන්දය පවත්වලා - අයථා ලෙස ගනුදෙනු කරලා ඡන්දයට ඉදිරිපත් වුණු අයගේ පරීක්ෂණ පවත්වලා තිබෙනවා, විරෝධතා ඉදිරිපත් කරලා. අධ්‍යක්ෂ මණ්ඩලය තෝරන්න ඒ විරෝධතා පිළිබඳ පරීක්ෂණ තවම ඉවර කරලා නැහැ. ඉතින් මේකට වාරණ නියෝගයක් පනවලා තිබෙනවා. මහ සභාව පත් කරන්නට පෙර ඉක්මණින් පරීක්ෂණ ටික අවසන් කරලා ඒක පැවැත්වුවොත් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා. මේ වනවිට මීරිගම සමූපකාරයේ විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඔබතුමා මගින් ගරු ඇමැතිතුමාට දන්වන්නේ, ඒක ඉක්මණින් අවසන් කරන්නය කියලා, මහ සභා නියෝජිතයෝ තෝරන්න ඉස්සෙල්ලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මම මැතිවරණය පවත්වලා, සාධාරණ මැතිවරණයක් තියලා මහ සභාව තෝරන්න කටයුතු කළාම, ඒ සාමාජිකයන් විසින් වාරණ නියෝගයක් අරගෙන තිබෙනවා. එතකොට ඒ වාරණ නියෝගය අනුව මට කටයුතු කරන්න වෙලා තිබෙනවා. ඒ කටයුත්ත ඉෂ්ට කරලා නැවත මහ සභාව පත් කරන්න මම කටයුතු කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

වාරණ නියෝගය හරි ගරු සභාපතිතුමනි. ඒකේ විරෝධතාවය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම ඒ සම්බන්ධව විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මහ සභාව පත් කරලා නැති එකෙන් තමයි ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නිසා ගරු ඇමැතිතුමා ඔබතුමාට උත්තරයක් දුන්නා. ඒ පිළිතුරත් එක්ක අපි බලමු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

උත්තරය හරි. මම කිව්වේ නැත්නම් මෙතැන ප්‍රශ්නයක් ඇති –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය සභා කටයුතු කාරක සභාවට යොමු කරලා බලමු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මොකද, කොමසාරිස්තුමාටත් මම දැනුම් දෙන්න ගියා. කොමසාරිස්තුමාව අල්ල ගන්නත් බැහැ. නියෝජ්‍ය කොමසාරිස්තුමාව අල්ල ගන්නත් බැහැ. ඒ නිසා ඇමැතිතුමාටත් මම දැනුම් දුන්නා. මම සභාගත කරන්න ලිපියකුත් එවලා තිබෙනවා. ඒකත් මම දැන් ඇමැතිතුමාට ලබා දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයත් තියෙනවා. පසුගිය නිල වාර්තාවේ 09 වැනි පිටුව. පසුගිය සභා වාරයේදී මම විශේෂ ප්‍රකාශයක් කරමින් කුළුපන කණිෂ්ට විද්‍යාලය ගැන කථා කළා. ඒකේ දෙමව්පියෝ දීපු ලිපි ගොනුව මම සභාගත කළා. ඒක මේ වාර්තාවේ නැහැ. ඒක නිවැරැදි කරලා මේ වාර්තාවට ඇතුළත් කරන්න කියන එක මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අන්තිමට සභාගත කළා කියලා තිබෙනවා. ඒක මේකේ සඳහන් වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඉදිරිපත් කරපු ලේඛනයක් තිබිලා තිබෙනවා. දෙමව්පියන් අත්සන් කළ ලේඛනයක් තිබිලා තියෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

දෙමව්පියන් ඉල්ලපු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම ලේඛන අපි නිල වාර්තාවට ඇතුළත් කරන්නේ නැහැ. නමුත් වාර්තාව අපි යවන්න ඕනෑ කරන අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට යොමු කරනවා, ඒ අනුව පරීක්ෂණයක් පවත්වන්න කියලා.

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය ඔක්තෝබර් මාසේ 14 වැනිදා දිවයින ඉරිදා සංග්‍රහයේ සහ ලක්බිම පුවත්පතේ පළ වෙලා තිබෙනවා, මගේ නම සඳහන් කරලා පහේ ශිෂ්‍යත්වය සමතුන්ට BMW දෙන්න මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් කියන Headline එක යටතේ. ඉරිදා සංග්‍රහයේ. මම හිතනවා, ඒ තුළින් මට විශාල හානියක් සහ අපකීර්තියක් සිද්ධ වෙලා තිබෙනවා. මගේ නම පාවිච්චි කරලා තිබෙනවා. නමුත් ඒ කරුණට මගේ කිසිම අදාළකමක් නැහැයි කියන එක මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාත් එක්ක සහභාගී වුණු සාකච්ඡාවකදී අම්ජාඩ් මන්ත්‍රීතුමාගේ නම සඳහන් කරලා ඒ ප්‍රකාශය සටහන් කරලා තිබෙන්නේ. ඒ නම අජ්මාල් මවුජුඩ් වශයෙන් වෙනස් වෙන්න ඕනෑ. ඒක නිවැරැදි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම ඒ සම්බන්ධයෙන් පුවපත්පත්වලට ප්‍රකාශයක් කළා. නමුත් ඒකත් සටහන් වෙලා තිබුණේ නැහැ. මම මේ අවස්ථාවේ දිවයින ඉරිදා සංග්‍රහයෙන් කාරුණිකව විශේෂ ඉල්ලීමක් කරනවා, ඒක සංශෝධනය කරන්න කියලා. මේ සම්බන්ධව මට Face Book එකෙන් විශාල අවමානයක් සිදු වෙමින් පවතිනවා. ඒක මම මේ අවස්ථාවේ සභාවට ඉදිරිපත් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව මම මේ අවස්ථාවේ සභා ගර්භයේ රැඳී සිටින මාධ්‍යවේදීන්ගෙන් විශේෂ කොට ඉල්ලීමක් කරනවා, එතුමාගේ ඉල්ලීම නිවැරැදි කරන ලෙස.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. හෝමාගම සමූපකාර සමිතිය පිළිබඳව. මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා මේ පළාතේ වැඩි හරියක් සමූපකාර සමිති කල් දාන්න තමයි ඉල්ලීම් කරන්නේ. කල් දාන්න, කල් දාන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. නැතුව ඔක්කෝම ප්‍රශ්න මෙතැන කථා කරන්න බැහැ.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

සාමාජිකයෙක් නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාජිකයෙක් වශයෙන්.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, ඒ නිසා ගරු ඇමැතිතුමාට නියෝගයක් දෙන්න නියමිත වේලාවට ඡන්දය පවත්වන්න කටයුතු කරන්න කියලා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඒක හොඳ යෝජනාවක්. මමත් සතුටු වෙනවා. මොකද, මේ සභාවේ මන්ත්‍රීවරු ඔක්කෝම ඉන්න තැන මම කියන්නේ, මට ආයිත් කල් දාන්න කියලා කියන්න එපැයි කියන්න. මම නියම වෙලාවට චක්‍ර ලේඛනයක් ගහලා - දේශපාලන අධිකාරිය මට නැවත බල කරන්න එපා. මට සාධාරණව ඡන්දය තියන්න අවසර දෙන්න.

# මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ් රෙස්ටුරන්ට් - නාම ලියාපදිංචිය
MINISTRY OF CRAB RESTAURANT - REGISTRATION OF NAMES

**02.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V(01)12/22)**

අ. "මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්" නමින් කොළඹ නගරයේ ව්‍යාපාරයක් (රෙස්ටුරන්ට්) ලියාපදිංචි කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ. එහි ව්‍යාපාරය සඳහා බස්නාහිර පළාතේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචිය ලබා දී තිබේද?

ඇ. "මිනිස්ට්‍රි ඔෆ්" යන වචනය ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට යොදා ගැනීමට නොහැකි බව ඔබතුමා දන්නෙහිද?

ඈ. ලියාපදිංචි කර නොමැති නම් එකී ව්‍යාපාරයේ නාමය යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)

Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

අ. නැත.

ආ. නැත.

ඇ. "මිනිස්ට්‍රි" යන වචනය ව්‍යාපාරය නාමයක් වශයෙන් ලියාපදිංචි කිරීමට යොදා ගත හැකි/නොහැකි බවට විධිවිධාන 1990 අංක 04 දරන බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ නොමැත. එසේ වුවද 2012.10.15 දින සිට ක්‍රියාත්මක වන අංක 1779/13 හා 2012.10.10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා සහ සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හී ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මගින් එවැනි ව්‍යාපාර නාම තහනම් කරනු ලැබූ ව්‍යාපාර නාම වශයෙන් දක්වා ඇත.

ඈ. "මිනිස්ට්‍රි ඔෆ් ක්‍රැබ්" යනුවෙන් ආයතනයක් ලියාපදිංචි නොකර පවත්වාගෙන යන්නේ නම්, 2012.10.15 දින සිට ක්‍රියාත්මක වන අංක 1779/13 හා 2012.10.10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා සහ සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හී ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 8 වන වගන්තිය අනුව එහි නාමය සංශෝධනය කර ලියාපදිංචි කිරීමට හෝ එසේ සංශෝධනය නොකරන්නේ නම් ආයතනය වසා දැමීමට කටයුතු කරනු ලැබේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් අහන්නේ, දැන් මෙතුමා සඳහන් කරපු ගැසට් නිවේදනය බස්නාහිර පළාත් සභාව තුළ සම්පූර්ණයෙන් රීතියක් බවට පත් වෙලා නැහැ නේද? ගැසට් කරලා අවසාන නැහැ. දැන් ඒකේ හෙට දවසේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට අතුරු ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හෙට දිනයේ එම ආයතනය ලියාපදිංචිය සඳහා Application එකක් පිරෙව්වොත් තවම පනතක් බවට පත් වෙලා නැති නිසා භාර ගන්න වෙනවා නේද? ඒක එක ප්‍රශ්නයක්. දෙවැනි ප්‍රශ්නය අවලංගු කරනවා නම් අවලංගු කිරීමට ඔබතුමා ගන්නා වූ කාලය කොපමණද?

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඒ සඳහා පසුව පිළිතුරු ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව කරුණු සොයා බලා ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් පසුව පිළිතුරු සපයාවි.

# BTT සහ NBT ආදායම
BTT AND NBT REVENUE

**03.**

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V(01)12/23)**

අ. 2010 වසරේ බස්නාහිර පළාතේ ව්‍යාපාර පිරිවැටුම් බදු (B.T.T) ආදායම කොපමණද ?

ආ. 2011 වසරේදී අවලංගු කරන ලද B.T.T බදු ආදායම වෙනුවට මෙම පළාත් සභාවට ලැබෙන ජාතිය ගොඩනැඟීමේ බද්ද (N.B.T) තුළින් පසුගිය සැප්තැම්බර් 31 දක්වා ලැබුණු ආදායම කීයද?

ඇ. 2011 වසර සඳහා ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් අපේක්ෂිත ආදායම ලෙස අයවැයේදී පෙන්වා දී ඇති මුදල කීයද?

ඈ. ඉතිරි මුදල අය කර ගැනීමට ගන්නා පියවර කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. පිරිවැටුම් බදු (B.T.T) ආදායම රු.ද.ල. 12,747 කි. (රුපියල් දසලක්ෂ දොළොස් දහස් හත්සිය හතලිස් හතකි)

ආ. පිරිවැටුම් බදු අහෝසි කිරීම මත ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු ලැබේ. ඒ යටතේ 2011 වර්ෂය සඳහා ලැබී ඇති මුදල රු.ද.ල. 10,608 කි. (රුපියල් දසලක්ෂ දසදහස් හයසිය අටකි) 2012 වර්ෂයට අදාළව 2012.09.30 දින දක්වා ලැබී ඇති මුදල රු.ද.ල. 9,512 කි. (රුපියල් දසලක්ෂ නව දහස් පන්සිය දොළහකි)

ඇ. 2011 වසර සඳහා ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තුවලින් අපේක්ෂිත ආදායම ලෙස ඇස්තමේන්තුවල දක්වා ඇති මුදල රු.ද.ල. 11,676 කි. (රුපියල් දසලක්ෂ එකොළොස් දහස් හයසිය හැත්තෑ හයකි)

ඈ. 2011 ඌනතාවය වෙනුවෙන් රු.ද.ල. 1,000 (රුපියල් දසලක්ෂ දහසක) මුදලක් භාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම උත්තරයෙන් මුද්දර ගාස්තු බලාපොරොත්තු වුණේ නැහැ. මම ඔබතුමාගේ පිළිතුරෙන් බලාපොරොත්තු වෙන්නේ, B.T.T වෙනුවට යොදා ගත්තු ජාතිය ගොඩනැගීමේ බද්දෙන් ලැබෙන ආදායම.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ ගැන තමයි මම කිව්වේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා ඒකට මුද්දර ගාස්තුත් එකතු කරලා කිව්වේ.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒකේ දාලා තියෙන්නේ, අපේක්ෂිත ආදායම ලෙස ඇස්තමේන්තුවල දක්වා ඇති මුදල කියලා. මේ දෙක එකට තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මට ඕනෑ B.T.T වලින් විතරක් ලැබෙන මුදල.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපේ ඇස්තමේන්තුවල ඔබතුමන්ලා අයවැය පොත බැලුවොත් දකින්න පුළුවන් -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒකේ මම දැක්කා. නමුත් -

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දෙකෙන්ම කියලා ඒකේ තියෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම වෙන වෙනමයි - ඔබතුමාගෙන් Breakdown එකයි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මම සොයා බලා පිළිතුරු ලබා දෙන්නම්. මොකද, එහෙම වෙන් කිරීමක් කරලා නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් වෙනම වෙනම ඒක ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඒ පිළිබඳව අපට දිගින් දිගටම විවාදයකට යන්න අමාරුයි. ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඒ සම්බන්ධව පසුව උත්තරයක් දෙනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අවසාන ප්‍රශ්නයට පිළිතුර රු.ද.ල. 1,000 ක මුදලක් භාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න කැමැතියි. ඒ ප්‍රශ්නය මතු වෙන්නේ, පසුගිය සභා වාරයේදී රීති අංක 107 යටතේ රීති අත්හිටුවීමක් කරලා සභාවට යෝජනාවක් ඉදිරිපත් කළාම ඔබතුමා 53 (1) රීතිය එහි සඳහන් වෙලා තිබෙනවාය කියන කාරණය මත ස්වයංව වාරණයක් පැන වෙනවාය කියලා ඒ යෝජනාව සභාවේ සාකච්ඡාවට ගන්න දෙන්න පුළුවන්කමක් නැතෙයි කියලා ප්‍රකාශ කළා. මම හිතන්නේ ගරු සභාපතිතුමනි, මේ කාරණයත් එක්ක

කාර්ය පටිපාටි රීති පිළිබඳව නැවත වරක් ඉතාම හොඳින් විමර්ශනය කරන්න ඕනෑ වකවානුවකට අපි ඇවිල්ලා ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. කාර්ය පටිපාටි රීති අත්හිටුවීමේදී 107 යටතේ කරන්නේ, හදිසියේ කළ යුතුව ඇති අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා කාර්ය පටිපාටි රීති එකක් හෝ කීපයක් හෝ බාධාවක් බව පෙනෙනවා නම් රීති අංක අත්හිටුවලා සාකච්ඡාවට ගන්න ප්‍රමුඛතාවය ලබා දීමයි. එතකොට ඒ කාරණයේදී 53 (1) යටතේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් මේ න්‍යාය පත්‍රයේ එනවා. ඒකේදී 53 (1) කියන්නේ,

"*පොදු වැදගත්කමකින් යුත් නෑම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීමට කිනම් මන්ත්‍රීවරයකුට වුව ද හැකි විය යුතුය.*"

ඒත් එක්කම 53 (2) කියන්නේ, "*එම යෝජනා ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව .......*" ඒ කියන්නේ පළමුවැනි එකේ කියනවා හැම මන්ත්‍රීවරයෙකුටම පොදු වැදගත්කමකින් යුතු යම් යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. එම යෝජනා ලේකම්වරයාට භාර දීලා එය සභාපතිවරයාගේ අවධානයට යොමු කරලා ඒ යෝජනාව පිළිබඳව සභා කටයුතු කාරක සභාවේ අදහස් විමසලා එය න්‍යාය පුස්තකයට ඇතුළත් කරන්න ඕනෑය කියලා. විශේෂයෙන් 53 (1) රීතිය මේ සභාවේ භාවිතා වෙන්නේ, නැහැ. නමුත් මගේ පුද්ගලික පිළිගැනීම 53 (1) රීතියෙන් කියන න්‍යාය පත්‍රයේ තිබෙන යෝජනාව 107 කියන කාර්ය පටිපටි රීති අත්හිටුවීමෙන් අපි වැළැක්වූවේ නැත්නම් අනිවාර්යයෙන්ම සභාවේ න්‍යාය පත්‍රය සාකච්ඡාවට ගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ කාරණය පිළිබඳ වැඩිදුරටත් මම මතක් කරන්න කැමැතියි. 1997 තමයි මේ කාර්යපටිපාටි රීති හදලා තියෙන්නේ. නමුත් මම ඔබතුමාට කියන්න කැමැතියි. එදා රේණුක පෙරේරා[1] ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා මේ පිළිබඳව කථා කළා. මම කියන්න කැමැතියි එතුමාත් 53 (1) යටතේ රීති අත්හිටුවීමක් ගෙනැල්ලා මේ සභාවේ සාකච්ඡා කරලා තිබෙනවා. ඒ තමයි 2005 ජනවාරි මස 04 වන දින සභා රැස්වීමේදී රීති අංක 107 යටතේ රීති අත්හිටුවා යෝජනාවක් ගෙනැවිත් ඇති අතර, එතුමා එම රීති අත්හිටුවීමේ යෝජනාවේ රීති අංක 53 (1) අත්හිටුවලා තියෙනවා. ඒ වාගේම හිටපු මන්ත්‍රීතුමා මෝහන්[2] මැතිතුමා 2004.11.23 වැනි දින ඒ විදියටම කරලා තිබෙනවා. ඒ වාගේම සිරිපාල අමරසිංහ[3] මන්ත්‍රීතුමා 2003.01.07 වන දින 107 රීතිය යටතේ අත්හිටුවීමේ යෝජනාවක් අනුව 53 (1) රීතිය යටපත් කරලා මේ සභාවේ සාකච්ඡා කරලා තිබෙනවා. එතකොට ගරු සභාපතිතුමනි, මේ සියල්ලම තිබෙනවා. මේ සභාවේ සාකච්ඡා වුණු ඒවා. ඒ නිසා මම කියන්නේ, ඔබතුමාගේ තීන්දුවෙන් එදා මට බලවත් අසාධාරණයක් සිද්ධ වුණා. ඒ නිසා මම හිතන්නේ, කාර්ය පටිපාටි රීති පිළිබඳව මේ ඇති වුණු ප්‍රශ්නය මත රීති කාරක සභාවට යොමු කරලා ඇත්ත වශයෙන්ම යෝජනාවකදී අත්හිටුවිය යුතු රීති අංක මොනවාද කියන එක පැහැදිලිව මේ සමස්ත සභාවම දැනුවත් කරන්න තීන්දු ගන්නය කියන එක මතක් කරනවා.

ඒ වාගේම අපි දීර්ඝ කාලයක් තිස්සේ මේ සභාවේ අලුත් කාර්යපටිපාටි රීති හඳුන්වා දීමක් කරලා, මේ සභාව යෝජනා ස්ථිර කරලා තියෙද්දී ජනාධිපති ලේකම් කාර්යාලයට අනුමැතියට යවන්න ඕනෑ කියලා දැනට මාස 08 කටත් වැඩියි. ඒ නිසා අපි කනගාටුවට පත් වෙනවා, සභාව පවත්වාගෙන යාමේ රීති ටික අදත් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාර දීලා තිබෙනවා නම්, මේ පළාත් සභාව ක්‍රියාත්මක වෙන්නේ ඒ නීතිරීති මත නම් මේ තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ප්‍රමාද වෙනවා නම්, මේ රටේ ජනාධිපති ලේකම් කාර්යාලයකට පළාත් සභාවකින් ඇත්තෙන්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පැහැදිලියි. අපි ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, මම කියන්නේ ගරු සභාපතිතුමනි -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ජනාධිපති කියනකොට කලබල වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලියි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පැහැදිලිව එදත් මේ පිළිබඳව මතක් කළා. ජනාධිපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක්. ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය යොමු කළා නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජනාධිපති ලේකම් කාර්යාලයට යවපු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එතැනට අදාළව කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

---
[1] කථාව අවසානයේ පළ කර ඇත.
[2] - එම -
[3] - එම -

මේ වාර්තාවට දැන් අට මාසයක් වෙලා තිබෙනවා නම් රටේ අනෙක් කාරණා ගැන මොන කථාද කියන එක තමයි තමුන්නාන්සේට මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

***[සභාගත කළ ලේඛන]**
[Documents Tabled]*

***රේණුක පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලදුව අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.***

*"ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හදිසිවූත් වැදගත් වූත් අවශ්‍යවූත් යෝජනාවක් ගෙන ඒම සඳහා මෙම පළාත් සභාව විසින් සම්මත කර පවත්වාගෙන යනු ලබන රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුශංගිකව පවත්නා කාර්ය පටිපාටි රීතිවල අංක 08 රීතියේ 5 සහ 6 උප රිතිද 15 රීතියේ 5 සහ 7 උප රිතිද 53 රීතියේ 1, 2 සහ 3 උප රීතිද 57 රීතියේ 1,2,3 සහ 4 උප රිතිද රිති අංක 55 ද අත්හිටුවිය යුතු යැයි මෙම සභාවට යෝජනා කරන්නීය."*

***ඇම්. මෝහන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.***

*"රීති අංක 107 මඟින් ඉඩ සලසා ඇති පරිදි පහත සඳහන් යෝජනාව අද දින විවාදයට ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට ඔබතුමාගෙන් අවසර පතමි.*

*අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සලකා අද දින මෙම යෝජනාව සාකච්ඡා කිරීමට ඉඩ සලසා ගැනීම සඳහා යෝජනාව අවසන් වන තුරු රිති අංක 53 (1), 53 (2), 53 (3), 57 (1), 57 (2), 57 (3), 57 (4), 57 (5), 8 (5), 8 (6) හා 15 (2), 15(4), 15(5) අත්හිටවන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරන්නීය."*

***සිරිපාල අමරසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව පියසිරි විජේනායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.***

*"ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ කාර්යය පරිපාටි රිති අංක 107 යටතේ සලසා තිබෙන ප්‍රතිපාදන යටතේ පොදු වැදගත්කමකින් යුතු අත්‍යවශ්‍ය එමෙන්ම හදිසි යෝජනාවක් අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට ඉඩ සලසා ගනු පිණිස අදාල සභා රීති අත් හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කරමි.*

*ඒ අනුව මතු සඳහන් යෝජනාව සාකච්ඡා කිරීමට එම යෝජනාව සාකච්ඡා කර අවසන් වනතුරු සභාව පවත්වාගෙන යාම පිණිසත් ඉඩ සැලසෙන අයුරින් රීති අංක 53(1)(2)(3), 57(1)(2)(3)(4)(5) හා 08(5)(6) හා 13(2)(4)(5), අත්හිටුවිය යුතු යැයි යෝජනා කරන්නීය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව මමත් දිගින් දිගටම කරුණු සොයා බැලුවා. දැනට තිබෙන රීතිවල යම් යම් විෂමතා වෙනස්කම් තිබෙන නිසා මම මේ අවස්ථාවේදී මෙම කාරණාව සම්බන්ධව කාර්ය පටිපාටි රීති කාරක සභාවට මෙම රීති ප්‍රශ්නය යොමු කරනවා. එම රීති පිළිබඳව කඩිනම්ව විමසා බලා සභාවට වාර්තා කරන්නය කියලා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම මේ සභාවට විශේෂ ප්‍රකාශයක් කරන්න උත්සාහ කළේ, Daily mirror පුවත්පතට ඔක්තෝබර් මස 16 වැනිදා හිටපු අග්‍රවිනිශ්චයකාර සරත් එන්. සිල්වා මැතිතුමා විසින් කරන ලද පුදුමාකාර ප්‍රකාශය සම්බන්ධයෙන් මේ සභාවේ අපි සියලු දෙනාම විමතියට පත්ව ඇති නිසයි. විශේෂයෙන්ම සුනාමි ව්‍යසනයෙන් පසුව හෙල්පින් හම්බන්තොට පෞද්ගලික ගිණුමක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මැතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන ලද නඩුවක තීන්දුව ඉතාම පැහැදිලිව තිබුණා. එතුමාට ජනාධිපතිතුමාගෙන් සමාව ගන්නා ලෙසත්, රුපියල් ලක්ෂයක මුදලක් නඩු ගාස්තු ලෙස ගෙවන ලෙසත් එවකට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරලා තිබුණා. එම නඩු තීන්දුව ශ්‍රී ලාංකීය කිසිදු පුරවැසියෙකු අභියෝගයට ලක් කරමින් ජාත්‍යන්තර උසාවියක හෝ මෙරට හෝ කිසිදු දිනක ප්‍රශ්න නොකළ නඩු තීන්දුවක් බවට ඉතිහාසයේ පත් වුණා. අද ඒ නඩු තීන්දුවෙන් අවුරුදු 07 කට පස්සේ, එදා ඒ නඩු තීන්දුව දුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාරවරයා පවසනවා, Ex-CJ says if not for his order Mahinda Won't be President today. ඔහු ඒ නියෝගය නොදුන්නා නම් මහින්ද රාජපක්ෂ අද ලංකාවේ ජනාධිපති නොවෙයි කියලා විශේෂ ප්‍රකාශයක් -

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගරු සභාපතිතුමනි, නඩු තීන්දු පිළිබඳව කිසිම විග්‍රහයක් කරන්න බැහැ. පුවත්පත් හෝ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නඩු තීන්දුවක් ගැන නොවෙයි. ඔබතුමා කළබල වෙන්න එපා. මේ ජනාධිපතිතුමාට නොවෙයි මුකුත් කියන්නේ. පටලවා ගන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හැකිතාක් දුරට –

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපි ජනාධිපතිතුමාට නොවෙයි කියන්නේ ගරු සභාපතිතුමනි. මේ මොකක්ද කියන්නේ? අපි ඒ නඩු තීන්දුවට ගරු කරපු මිනිස්සු. ඒ නඩු තීන්දුවට ගරු කරපු මිනිස්සු මේ කථා කරන්නේ. ඔබතුමා බොරුවට කෑගහනවා. ගරු සභාපතිතුමනි, අද අවුරුදු 07 කට පස්සේ අග්‍රවිනිශ්චයකාරවරයා විධියට සිටි ඔහු මෙම ප්‍රකාශය කිරීමෙන් ගම්‍ය වන්නේ කුමක්ද? එහෙම නම් ඔහු හිතනවා, ඔහුගේ හෘද සාක්ෂිය ගැන. අපි කවුරුවත් මේ ප්‍රශ්නය සිවිල් සමාජයේ අහලා නැහැ. අද අවුරුදු 07 කට පස්සේ ඔහු පුවත්පතකට ප්‍රකාශයක් කරමින් කියන්නේ මොකක්ද? ඔහු කියනවාද ඔහුගේ හෘද සාක්ෂිය දුන්නු තීන්දුවද මේ කියලා. එහෙම නැත්නම් ඔහු අපේ සමාජයට මේ කියන්න උත්සාහ කරන්නේ මොකක්ද? අද අවුරුදු 07 කට පස්සේ ඔහු කියන්න උත්සාහ කරනවා මම දුන්නේ, නීතියේ සාධාරණත්වය නොවෙයි. මම දුන්නේ දේශපාලන තීන්දුවක්ද කියලා. ඔහු කියන්න උත්සාහ කරන්නේ කුමක්ද? ඒ හරහා අපට විවිධ ප්‍රශ්න මතු වෙනවා ගරු සභාපතිතුමනි. (බාධා කිරීම්) එතුමා කියන්නේ – මේ අපි අහන්නේ "ද" කියලා. සිංහල වචනය "ද" ගරු සභාපතිතුමනි, ඒ හරහා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු පසුගිය කාලයේ – එතුමා අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස හිටපු කාලයේදී දීපු තීන්දු එතුමා දුන්නේ හෘද සාක්ෂියට එකහවද, නැද්ද කියන එක පිළිබඳවත් අනාගතයේදීත් ගැටළු මතු වෙනවා. එතුමා මේ වාගේ ප්‍රකාශයක් කරයිද? මම දීපු තීන්දු නිසා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් අහිමි වුණා කියලා. එස්.බී. දිසානායක මැතිතුමා සම්බන්ධයෙන් –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය ලේඛනය සභාගත කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ මම කියන කාරණයයි වැදගත් වෙන්නේ. අග්‍රවිනිශ්චයකාරවරයාගේ ක්‍රියා කලාපයයි මම මේ කියන්න හදන්නේ. නැතුව තීන්දු ගැන නොවෙයි ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, මෙතුමා මේ මොනවාද කියන්න හදන්නේ. එහෙම නම් අද අපට සාධාරණ සැකයක් මතු වෙනවා, එතුමා දීපු තීන්දු සම්බන්ධව. එතුමා සැරින් සැරේ කරන ප්‍රකාශ සම්බන්ධයෙන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, එතුමාට අවුරුදු 07 ක් සිවිල් සමාජය අභියෝග නොකරපු කාරණයක් සම්බන්ධයෙන් එවකට සිටි අග්‍රවිනිශ්චයකාරවරයා විධියට මොකක්ද කියන්න හදන්නේ? එහෙම නම් ගරු සභාපතිතුමනි, නැවත නැවතත් අපි කියන්නේ, එතුමා උත්සාහ කරනවා එතුමාගේ හෘද සාක්ෂියේ තිබෙන තීන්දුව ජනතාව අතරට ගෙන එන්න. ඒ නිසා අපි අහන්නේ, එස්.බී. දිසානායක සම්බන්ධයෙන් දීපු තීන්දුවෙත් අනාගතයේ එතුමා මෙහෙම කියයිද? අපි අහන්නේ, එතුමාගේ තීන්දු ජාත්‍යන්තර අධිකරණයේ පවා අභියෝගයට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා අපි අහන්නේ ගරු සභාපතිතුමනි, ඔහුට මෙවැනි ප්‍රකාශ කිරීමේ අයිතියක් තිබෙනවාද? ඔහුගෙන් රට බලාපොරොත්තු වූ දේ ඔහු ඉටු කළාද කියන කාරණය අද දවසේ මේ සිවිල් සමාජයට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

ඔබතුමන්ලා මේ පටලවාගෙන. මේ පටලවාගෙන. මම කියන කාරණය අවබෝධ කර ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. ඔබතුමා ඔය ලිපිය සභාගත කරනවාද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

සභාගත කරනවා.[4]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මගේ කාලය ගත්තා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය හරි. ඔබතුමා කථා කළා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා අපි කියන්නේ අනාගතයේවත් මේ වාගේ වැරැදි නොකරන ක්‍රමවේදයක් මේ රටේ බිහි වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ පසුගිය දවස්වල අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන වාර විභාග ප්‍රශ්න පත්‍ර පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් CD එකක් යවලා තිබෙනවා අපේ පළාත් සභාවේ අධ්‍යාපන කලාප කාර්යාලවලට. අපට තිබෙන බලතලත් එක්ක බස්නාහිර පළාත ඇතුළත ක්‍රියාත්මක වන පාසල් ප්‍රමාණයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ අනුව ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අමාත්‍යාංශයෙන් ඒ යවපු වාර විභාග ප්‍රශ්න පත්‍ර ඇතුළත් CD එකේ ගුරුවරුන් විභාගයට ළමුන් යොමු කරවන්න එක එක විෂයයන් අනුව ගත්තු ප්‍රශ්න පත්‍ර අරගෙන බැලුවාම මම ඉතාමත් කනගාටුවෙන් කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, බුද්ධාගම ප්‍රශ්න පත්‍රය ඒකේ සඳහන් වෙලා නැහැ. එහෙම නම් මේ ප්‍රදේශයේ සියලුම පාසල්වල බෞද්ධ ආගම පිළිබඳව විෂයය අදාළව - මම හිතන්නේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ස්වාමීන් වහන්සේලා විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඊයේ පෙරේදා තිබුණු වාර විභාග -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පළමු වාරේ ප්‍රශ්න පත්තර පාසල් මට්ටමින් -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හදන එක කලාපයට ඇරියාම -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කලාපයෙන් නොවෙයි කරන්න හදන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අධ්‍යාපන අමාත්‍යාංශය තමයි CD එක එවලා තියෙන්නේ කලාපයට. ගරු සභාපතිතුමනි, ඒ එවලා තිබෙන CD එකේ බුද්ධාගම ප්‍රශ්න පත්‍රය නැහැ. ඒ නිසා ලොකු කලබලයකට පත්ව ඒ ප්‍රදේශයේ පාසල්වල ගුරුවරුන් සහ ඒ වාගේම දෙමව්පියන් අපට කථා කරන්න පටන් අරගත්තා. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රය මේකේ නැහැයි කියලා. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔය කොයි කලාපයේද කියන්න?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

හොරණ කලාපයේ. මෙතැන අපේ ස්වාමීන් වහන්සේ නමකුත් ඉන්නවා. හොයලා බලන්න ඒ කමිටුවට පත් කරන්න. මේක අපේ මන්ත්‍රීවරු 104 දෙනාටම කරපු ලොකු අගෞරවයක්. මොකද, එලෙස ප්‍රශ්න පත්‍ර යවලා, වගකීමකින් වැඩ කටයුතු කරලා ඒ ප්‍රශ්න පත්‍ර හදන්න යවන වැඩ පිළිවෙළ තුළ විශාල අසාධාරණයක් මේ ප්‍රදේශයේ බෞද්ධ දරුවන්ට සිද්ධ වෙලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරලා දෙන්න කැමැතියි. සමහර කලාප කාර්යාල බැලුවාම ගුරුවරුන්ගේ හිඟය මොකක්ද කියලා. සමහර ඒවායේ කියනවා. හිඟයක් තිබෙනවා. ගුරුවරු නැහැයි කියනවා. තවත් පාසල්වල හොයලා බැලුවාම - මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ හොරණ දොන් පේද්‍රික් විද්‍යාලය. ඔබතුමා හොයලා බලන්න. ගුරුවරු විශාල ප්‍රමාණයක් තියාගෙන - අපි උපදේශක කාරක සභාවලට ගියාම අපේ කලාප කාර්යාලවලට එන වාර්තාවල පෙන්වන්නේ, ඒකට ගුරුවරු වැඩි නැහැ. අවශ්‍ය සංඛ්‍යාව ඉන්නවා කියලා. මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්න කැමැතියි මේ ප්‍රශ්න පත්‍ර පිළිබඳව ඇති වුණු ආරවුලත් ඒ වාගේම ගුරුවරුන් නැති පාසල්වලට ගුරුවරුන් යවනකොට නගරයේ තිබෙන පාසල්වල ගුරුවරු හංගාගෙන සිටීමේ වැඩ පිළිවෙළත් සොයා බලලා ඒ පිටිසර ගම්මානවල පාසල්වලට ගුරුවරුන්ව අනුයුක්ත කරලා විෂයයන් උගන්වන්න වැඩ කටයුතු කරන්න කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරනවා. විශේෂයෙන්ම අර ප්‍රශ්න පත්‍ර පිළිබඳව යවාපු දේ පිළිබඳව සොයා බලා අපි උපදේශක කාරක සභාවේදී කටයුතු කරමුයි කියන එක මතක් කරමින් මම මේ අවස්ථාවේදී මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා ප්‍රකාශයක් කරන්න දෙන්න අමාරුයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි ඒක උපදේශක කාරක සභාවේදී අරගමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වේලාව ලබා දීම පිළිබඳව ස්තුතියි. මා මේ සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි, පසුගිය අවස්ථාවේ ප්‍රකාශයක් කරමින් කටාන විවිධ සේවා සමූපකාරයේ රුපියල් ලක්ෂ 30 ක මුදලින් විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගෙන - ගරු සභාපතිතුමනි, ඒ වනකොට විදුලි ජනක යන්ත්‍රයක් මෙම සභාව සතුව තිබුණේ නැහැ. ඊට අමතරව සීදූව ප්‍රදේශයේ

සමුපකාරය සතු ඉඩමක ඉදි කරපු ගොඩනැගිල්ලට සැබෑවට වැය කරපු මුදලට වැඩිය විශාල වියදමක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමියට බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීවරු නිහඬ වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ එක්කම සමුපකාර සමිතියේ තැන්පත්කරුවන්ගේ මුදල්වලින් වියදම් වශයෙන් වැය කළ හැකි ප්‍රතිශතයට වැඩි ප්‍රමාණයක් වැය කිරීම සම්බන්ධයෙන් සහ සේවිකාවකට ලිංගික අතරව කිරීමට තැත් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙනුත් මෙම පරීක්ෂණ සඳහා ගිය නිලධාරීන් ගමන් කළ රථයට අසූචි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙනුත් මා හෙළිදරව්වක් කළා. මේ වනවිට කොමසාරිස් පාලනයට මෙම සභාව යටත් කර තිබෙන බව අපට දැනගන්නට ලැබිලා තියෙනවා. අපේ සමුපකාර ඇමතිතුමාත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන් සොයා බලලා තියෙනවාද? මේ වනවිට එහි ප්‍රගතිය කුමක්ද? මේ අක්‍රමිකතා සම්බන්ධයෙන් අරගෙන තියෙන ඉදිරි පියවර කුමක්ද? කියන එක ගැන සොයා බලන්න කියලා මා මේ අවස්ථාවේදී ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, ගරු සමුපකාර ඇමතිතුමාගේත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා එතුමාගේ පැහැදිලි කිරීමේදී කළ පැහැදිලි කිරීම පිළිබඳව ඔබතුමා හරහා දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. නැත්නම් වැරදි විදියට මේක මාධ්‍යයට යනවා. පාසල් ප්‍රශ්න පත්‍ර හදද්දි පළමුවැනි වාරයේදී පාසල් මට්ටමින් ඒ ප්‍රශ්න පත්‍ර සකස් කළා. දෙවැනි වාරයේදී කලාප මට්ටමින් කෙරෙන්නේ. තුන්වැනි වාරයේදී තමයි පළාත් දෙපාර්තමේන්තුව හරහා කරන්නේ. එතුමා ගේ සාකච්ඡාවේදී සාකච්ඡාවට භාජනය වුණු කරුණ කලාප මට්ටමෙන් සකස් කරපු ප්‍රශ්න පත්‍රයක්. එතකොට කලාපයෙන් තමයි ඒ CD එක හදලා යොමු කිරීම කරන්නේ. මේ වාගේම සිද්ධියක් කොළඹ කලාපයේ සිදු වෙලා කොළඹ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණකාධිකාරී ඇතුළු සියලු වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව පරීක්ෂණයක් කරලා ඒ අයව ඒ ස්ථානවලින් මාරු කරන්නත්, ඒ අයට දඬුවම් ලබා දෙන්නත් අපි කටයුතු කරලා තියෙනවා. ඒ වාගේම හොරණ එක ගරු සභාපතිතුමනි. පළමුවැනි වතාවට තමයි. ඒ සම්බන්ධව තොරතුරු අපට ලබා දුන්නොත් ඒ පිළිබඳව කටයුතු කරන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න කැමැතියි. විශේෂයෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයක් පිළිබඳව අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා දීපු පිළිතුරේ එතුමා මේ ආදායම් වියදම් පිළිබඳව ලැබුණු ඇස්තමේන්තුවල අපිට ලැබෙන සත්‍ය තොරතුරු ඇස්තමේන්තුව පිළිබඳවත්, ඒ දීපු පිළිතුර පිළිබඳවත් යම් පරස්පර විරෝධතාවයන් තියෙනවා. අපිත් මේවා ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නවා. මම දන්නේ නැහැ කොතැන හරිද? කොතැන නිවැරදිද කියලා. ඒ නිසා එතුමාගේ පිළිතුරේ යම් ප්‍රමාද දෝෂයක් තියෙනවාය කියන එක මම මතක් කරන්න කැමතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ වේලාවේ පැහැදිලිව ප්‍රකාශ කළා, පසුව ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙනවා කියලා. ඔබතුමා ලිපිය සභාගත කරන්න.

මෙම අවස්ථාවේදී මෙම ගරු සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.39 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspended until 11.39 a.m. and then resumed.*

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරන ලද වරප්‍රසාද ප්‍රශ්නයේදී, මා මේ සභාවේ 53 (1) රීතිය යටපත් කර ගෙන සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව මගේ ලිපි තියෙනවා. මේවා හැන්සාඩ්ගත[5] කරන්න කියලා ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න. න්‍යාය පත්‍රය අනුව ඊළඟට තියෙන්නේ සභාවේ කටයුතු පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම. ඒ එක්කම ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාට -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ගරු සංවිධායකතුමා විතරයි මෙතැන ඉන්නේ. ආණ්ඩු පක්ෂය මේ පළාත් සභාව ගෙනියන්න කොයි විදියටද කියලා මම දන්නෙ නැහැ. කනගාටුවට කාරණයක්. ඔබතුමා න්‍යාය පත්‍රයානුකූලව සභාව ගෙන යන්න කියලා ඉල්ලීමක් කරනවා.

---

[5] වරප්‍රසාදය ප්‍රකාශ අවසානයේ පළ කර ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිවරයෙක් ඉන්නම ඕනෑ සභාව ඇතුළේ. ඒකයි ප්‍රශ්නය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවට අගෞරව කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

ඇමතිතුමන්ලාට වෙලාවට සභාවට එන්න කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න. අපි තේ විවේකයට පැයකට ආසන්න කාලයක් වෙන් කළා. න්‍යාය පත්‍රය අනුව, මමත් කැමැත්තෙන් ඉන්නේ වෙලාවට යන්න. නමුත් සභාවේ කටයුතු සඳහා [ ගරු සභාපතිතුමා ]

යෝජනාව ඉදිරිපත් කරන්න සභා ගර්භය තුළ ඇමතිවරයෙක් ඉන්න ඕනෑ. ඒ නිසා මේ අවස්ථාවේ සභා කටයුතු ගරු අමාත්‍යතුමා සභා ගර්භය තුළ නැහැ. මම උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාට ආරාධනා කරනවා සභාවේ රැස්වීම් සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කිරීමට.

# පළාත් සභාවේ රැස්වීම : අයවැය විවාද දින
PROVINCIAL COUNCIL MEETING : DATES OF BUDGET DEBATE

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා) [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.) [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"2013 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන් මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා, 2012.10.10 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයද සැලකිල්ලට ගෙන "2012 දෙසැම්බර් මස 05, 06, 07 සහ 10 යන දිනයන් 2013 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්" විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ එක්කම මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් කාර්ය පටිපාටි රීති 107 යටතේ රීති අත්හිටුවා යෝජනාවක් ඉදිරිපත් කරල තිබෙනවා. ඔබතුමාගේ රීති අත්හිටුවීමේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමට පෙර ගරු අමාත්‍යතුමා විසින් අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු යෝජනාව ඉදිරිපත් කළා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, සාමාන්‍යයෙන් රීති අංක 107 යටතේ යෝජනාවක් ගෙනාවාම රීති අත්හිටවලා තමයි ඉස්සරහට යන්න යන්නේ. මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනැල්ලා තියෙනවා. ඒක අනුව තමයි අපේ තීන්දුව දෙන්න ඕනෑ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මීට කලින් මේ සභාවේ සම්ප්‍රදායක් විදියට මම දන්න විධියට නම් රීති අත්හිටවලා යෝජනාවක් ගෙනාවා නම් ඒකට ප්‍රමුඛත්වය අරගෙන තමයි කටයුතු කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන මම බැලුවේ අතිශය වැදගත් යෝජනාවක් තියෙනවා සෞඛ්‍ය අමාත්‍යංශයේ. මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීම රීති සම්බන්ධ යෝජනාව. ඒ නිසා අපි ඒක අරගෙන ඊට පස්සේ ඔබතුමාට අවස්ථාවක් ලබා දෙන්නම්.

# පොදු කටයුතු
PUBLIC AFFIRS

## 2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පිඩා වැළැක්වීමේ රීති
RULES FOR PREVENTION OF PUBLIC HEALTH HAZARDS NO. 03 OF 2012

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Udaya Prabhath Gammanpila - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු සභාපතිතුමනි, *2012 අංක 03 දරණ මහජන සෞඛ්‍ය පිඩා වැළැක්වීමේ ප්‍රඥප්තියේ 21 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වන මා වෙත පැවරි ඇති බලතල අනුව සම්පාදනය කරන ලද,*

*"2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පිඩා වැළැක්වීමේ රීති" නම් වූ රීතීන්,*

*අංක 1771/23 හ 2012 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා දාතමින් යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශේෂ - IV (අ) වැනි කොටස - පළාත් සභා) මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර එම රීතීන් යථෝක්ත ප්‍රඥප්තියේම 21 (3) උප වගන්තියට අනුකූලව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***අනතුරුව, එකී රීතීන්, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Accordingly, it was ordered by the Hon. Chairman to forward the Statute to the Committee of Statutes and Laws*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කාර්ය පටිපාටි රීති 107 යටතේ රීති අත්හිටවා යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මම මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා එම යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඊට ප්‍රථම 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හේතුව තමයි, මීට ප්‍රථම මේ සභාවේදී මා විසින් ගරු කර්මාන්ත අමාත්‍යතුමාගේ අවධානයට යොමු කළා, දොඩංගොඩ තාක්ෂණ පාසල වැසීම සම්බන්ධයෙන්. එතුමා ඉතා ඉක්මණින්ම එය විවෘත කරන්න ඒ වෙලාවේ මේ සභාවට පෙරොන්දු වුණා. මම දන්නේ නැහැ, එතුමා නිලධාරීන්ව දැනුවත් කරලා තියෙනවාද නැද්ද කියලා. මේ වන තෙක් ඒ පාසල විවෘත කරන්නට කිසිදු කටයුත්තක් නිලධාරීන් හැටියට කවුරුවත් පියවර අරගෙන නැහැ. ඒ වාගේම ඒ තත්ත්වය යටතේ මේ ඊයේ පෙරේදා දිවයින පුවත් පතේ - මම මේක සභාගත කරනවා.

"වසා දැමීමේ පාපයට හසු වී වල පල්ලට යන කරපාගල වඩු පාසල." මේ පිළිබඳව ගරු සභාපතිතුමා මගින් ඇමතිතුමාට පැහැදිලි කිරීමක් කරන්න කැමතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා දිගින් දිගටම ඒ ගැන විස්තර කථා කරන්න අවස්ථාව ලබා දෙන්න බැහැ ඔබතුමාට. වරප්‍රසාද ප්‍රශ්නය යොමු කළා නම් හරි. ඔබතුමා සභාගත කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ කාරණය නොකිරීම නිසාම මේකත් වැසී ගෙන යනවා. ඒ නිසා තමයි මම හිතන්නේ, මේ පළාත් සභාව සුදු අලියෙක්ය. පළාත් සභා ඕනෑ නැහැ කියන තත්ත්වයට පත් වෙන්නේ. අමාත්‍යවරයා මැදිහත් වීමෙන් මේ කටයුතු නොකෙරෙන නිසා දැයි කියන එක තමයි අපට තියෙන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මම ඉදිරි සභා කටයුතු කාරක සභාවට යොමු කරනවා.

ගරු මන්ත්‍රීතමාට අවස්ථාව යෝජනාව ඉදිරිපත් කරන්න.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, *"හදිසි වූත්, අවශ්‍ය වූත් යෝජනාවක් ගෙන ඒම සඳහා මෙම පළාත් සභාව මගින් සම්මත කර පවත්වාගෙන යනු ලබන කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව පවත්නා කාර්ය පටිපාටි රීතිවල අංක 08 රීතියේ 5 හා 6 උපරීතිද, 15 රීතියේ 5 උපරීතිද, 53 රීතියේ 2 හා 3 උපරීතිද, 57 රීතියේ 2, 3 හා 5 උපරීතිද අත්හිටුවිය යුතු යැයි මෙම සභාවට යෝජනා කර සිටින්නීය."*

***හදිසි යෝජනාව :***

*"13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලෙස බලය බෙදා හැරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද වසර 24 ක් පුරා දිවයින තුළ සාර්ථකව ක්‍රියාත්මක වූ පළාත් සභා ක්‍රමය අහෝසි කිරීම සඳහා*

*ප්‍රතිගාමී ජාතිවාදී බලවේග යළිත් හිස ඔසවමින් ක්‍රියාත්මක වෙමින් පවතී.*

*දහස් ගණනගේ ජීවිත පරිත්‍යාගයෙන් ස්ථාපිත කරගන්නා ලද පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමට ගන්නා වූ මෙම ප්‍රයත්නයන් පරාජය කිරීම සඳහා සැවොම ඒකරාශී විය යුතුව ඇත.*

*මෙම තත්ත්වයට මුහුණ දී පළාත් සභා ක්‍රමය ආරක්‍ෂා කර ගැනීම සඳහා සියලුම පළාත් සභා එක්ව කටයුතු කළ යුතු යැයි මෙම ගරු සභාව යෝජනා කර සිටින්නීය."*

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව වැදගත් යෝජනාවක්. එහෙත් මෙම යෝජනාව, හදිසි යෝජනාවක් හැටියට අපි දකින්නේ නැහැ. මොකද, පළාත් සභා ක්‍රමය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා තිබෙන ආයතනයක්. ඒ සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා රජයක් හැටියට කිසිදු පියවරක් ආරම්භ කරලා නැහැ. යම් යම් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් මාධ්‍ය ඔස්සේ විවිධ ආකාරයේ ප්‍රකාශයන් සිදු කරනවා. ඒ ප්‍රකාශයන් මත මේ සභාවේ කටයුතු අත්හිටුවලා කඩිනමින් කෙරෙන කටයුත්තක් හැටියට විවාදයට ගත යුතු යැයි මා හිතන්නේ නැහැ. මා යෝජනා කරනවා එතුමාට, එතුමාත් මාත් 88 මේ අභියෝගයට මුහුණ දුන්න දෙන්නෙක් හැටියට, මේ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා විවාදයට ගනිමුයි කියලා. අයවැය විවාදය ඊළඟට පැවැත්වෙන්න තියෙනවා. අයවැය ඉදිරිපත් කරන්න තියෙනවා. සභාවේ න්‍යාය පත්‍රය අනුව අපට කටයුතු කිරීමට තිබෙනවා. ඒ නිසා මේ සභාවේ න්‍යාය පත්‍රය නවත්වලා, අත්හිටුවා ගැනිමට තරම් - 107 වගන්තියේ පැහැදිලිව කියා තිබෙන්නේ, හදිසියේ කළ යුතුව ඇති - ඒ කියන්නේ පළාත් සභා ක්‍රමය සම්බන්ධව මේ සතියේ පාර්ලිමේන්තුවේ යම් සංශෝධනයක් ගේනවා නම්, අපි මේ සම්බන්ධව සියල්ල අත්හිටුවලා ගත්තාට කමක් නැහැ. ඒ සම්බන්ධව රජයක් හැටියට කිසිම කටයුත්තක් කරලා නැහැ. යම් යම් අය තම තමන්ගේ දේශපාලන මතයන් හා ස්ථාවරයන් විවිධ අවස්ථාවල ප්‍රකාශ කර තිබෙනවා. ඒවා වරින් වර සිද්ධ වෙනවා. ඒ නිසා මේ යෝජනාව හදිසි යෝජනාවක් හැටියට ගත යුතු යැයි අපි සලකන්නේ නැහැ. ඒ නිසා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේක න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා සංවාදයට භාජනය කරමුයි කියලා. එතුමාත්, මමත් 1988 ඉඳලා (බාධා කිරීම්) වඩු පාසල වුණත් ඊට වඩා වැදගත්. විපක්ෂ නායකතුමාත් ඒකේ වැදගත්කම දැක්කා. වඩු පාසල. මම හිතන්නේ, එතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර විපක්ෂ නායකතුමත් විරුද්ධ වුණා. හදිසි යෝජනාවක් හැටියට එතුමා ඉදිරිපත් කළේ, අර යෝජනාවට කලින් වඩු පාසල සම්බන්ධව. ඒ කියන්නේ, ඒකෙන්ම තහවුරු වෙනවා, මීට වඩා වැදගත් කාරණා මේ සභාවේ කථා කළ යුතුව තිබෙනවායි කියන කාරණය ගරු සභාපතිතුමනි. ඒ නිසා මම ඔබතුමාට අපි ආණ්ඩු පක්ෂය හැටියට කියනවා -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ මඤ්ඤං කියවන්නේ. මේක නොවෙයි. ඇත්තෙන්ම අද දවසේ මේ රටේ ඉතාම වැදගත් මාතෘකාවක් විධියට මේ පළාත් සභා ක්‍රමය පිළිබඳව සාකච්ඡා වෙමින් යනවා. විවිධ පුද්ගලයෝ කියලා කියන්නේ කවුරුවත් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු. පක්ෂ නායකයෝ. අද පුවත් පතෙත් මේ පිළිබඳව තියෙනවා. ආරක්ෂක ලේකම්වරයා ප්‍රකාශයක් කරලා තියෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

කථා පවත්වන්න ඉස්සරවෙලා ඔබතුමා තීන්දුවක් දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ නැහැ. එහෙම නම් එතුමාටත් කථා පවත්වන්න බැහැ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවලා යෝජනාවක් ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ සම්බන්ධයෙන් එතුමාගේ අදහසක් ප්‍රකාශ කළා. එතුමා ඉදිරිපත් කළ යෝජනාවට ඔබතුමා එකඟද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මම එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් එතුමා ඉදිරිපත් කළ යෝජනාවට සභාවේ එකඟතාවය විමසන්න සිදු වෙනවා මට මේ අවස්ථාවේදී. සභාවේ එකඟතාවය ගන්න ඕනෑ. සිනුව නාද කරන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අනුව අපි යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. අපේ පළාත් සභාවේම ඉන්න උදය ගම්මන්පිල ගරු ඇමතිතුමාම කියනවා මේක විසුරුවන්න කියලා. ඇයි මේක ගන්න භය?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඝෝෂා කිරීම් කරන්න එපා. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවා යෝජනාවක් ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා ඒ සම්බන්ධව එතුමාගේ අදහස ප්‍රකාශ කළා. එතුමා ඉල්ලීමක් කළා, මේ සම්බන්ධව සභා කටයුතු කාරක සභාවට යොමු කරලා ඉදිරිපත් කරමු කියලා. ඉතින් ඒ සඳහා ඔබතුමා එකඟ නම් අපට පුළුවන් ඒ අනුව කටයුතු කරන්න. ඔබතුමා එකඟ නැත්නම් මේ යෝජනාව සම්බන්ධයෙන් අපට සභාවේ එකඟතාවය අනිවාර්යයෙන්ම අහන්න වෙනවා. සභාපතිතුමා වශයෙන් මාගේ කාර්ය භාරය ඒකයි. මෙයට එකඟ නැත්නම්, සභාවේ එකඟතාවය ගන්න මට සිදු වෙනවා. ඡන්දයකට ගිහින්, කරුණාකර සභාවේ එකඟතාවය - (බාධා කිරීම්)

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එකඟ නැත්නම් ඡන්දයකට යන්න. ඒක වෙනම දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් සීනුව නාද කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ පළාත් සභා ක්‍රමය රැක ගන්න අපි කථා කරන්නේ. වෙන මොකුත් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනය වශයෙන් මට - කරුණාකර සිනුව -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

රජයේ ස්ථාවරය කියන්න ඕනෑ. පළාත් සභාව විසුරුවනවාද? නැද්ද කියලා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාට විශේෂ ප්‍රකාශයක් කරන්න කියන්න ඉස්සෙල්ලා. තියෙන වරප්‍රසාද ඔක්කෝම ලබා ගෙන -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රජය එහෙම ප්‍රකාශයක් කරලා නැහැ. මේක රැක ගන්න දෙයක් නැහැ. මේක තියෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නමුත්රජයේ වගකිවයුත්තෝ ප්‍රකාශ කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අපි විවාද ගෙන යමු. මේ විවාදය ගෙන ගියාම හොඳයි. අර්ජුන රණතුංගත් ඉන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එකඟ වෙන්නේ නැත්නම් අපි රහස් ඡන්දයක් ඉල්ලනවා. මේ යෝජනාවට රහස් ඡන්දයක් ඉල්ලනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

රහස් ඡන්දයක් තියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පළාත් සභා ක්‍රමය ඕනෑද? නැද්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මීට සභාවේ කැමැත්ත විමසන්නේ නම් රහස් ඡන්දයක් පැවැත්විය යුතුයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ අවස්ථාවේදී ගරු විපක්ෂයේ සංවිධායකතුමා විසින් මූලාසනයට යෝජනාවක් ඉදිරිපත් කළා, එකඟතාවය සම්බන්ධව

රහස් ඡන්දයක් ගන්න කියලා. (බාධා කිරීම්) කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඒ සම්බන්ධව මට සිදු වෙනවා, රහස් ඡන්දයක් තියන්න. සභාව එකඟද?

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟ නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම යෝජනා කරනවා රහස් ඡන්දයක් තියන්න කියලා

[සභාවේ ඝෝෂා]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි. දැන් මේ ඡන්ද විමසීමට යන්නේ ඔබතුමා මේ යෝජනාවට පක්ෂවද? නැත්නම් යෝජනාව ගත යුතුයි කියන කාරණයටද? මොකද ගරු සභාපතිතුමනි, මාධ්‍යයට වැරදි ප්‍රකාශයක් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධව එකඟතාව විමසීම පිළිබඳව විපක්ෂ සංවිධායකතුමා රහස් ඡන්දයක් ඉල්ලුවා. නමුත් ඒ සම්බන්ධව විරෝධතාවයක් ආවා. ඒ නිසා මුලින්ම මම රීති අත්හිටවූ යෝජනාව ඉදිරිපත් කිරීමට පවත්වන ඡන්දය, රහස් ඡන්දයක් ලෙස පැවැත්විය යුතු යැයි කියලා යෝජනා කළා. ඊටද විරුද්ධ වුණු නිසා රහස් ඡන්දයක් පැවැත්විය යුතුද යන්න සඳහා සභාවේ එකඟතාව විමසා රහස් ඡන්දයක් ලබා ගැනිමට විරුද්ධ මන්ත්‍රීවරු ඉන්නවා නම් ඊටත් ඡන්දය ගන්න සිදු වෙනවා. රහස් ඡන්දයක් ලබා ගැනීමට විරුද්ධ මන්ත්‍රීවරු ඉන්නවා නම් නම් ඡන්දය ගන්න සිදු වෙනවා. ඒ නිසයි ඊට සභාවේ එකඟතාව විමසන්නේ.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 12 යි, විරුද්ධව 40 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 12 for, 40 against and 02 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාවට ඡන්දය විමසීමේදී රහස් ඡන්දයට විපක්ෂ ගරු මන්ත්‍රීතුමාලා ඡන්දය පාවිච්චි කරලා තියෙනවා 40 ක්. පක්ෂව ඡන්ද 12 ක් පාවිච්චි කරලා තියෙනවා. වැළකී සිටි මන්ත්‍රිතුමාලාගේ සංඛ්‍යාව 02 යි. රහස් ඡන්දයක් විමසීම පිළිබඳ වැඩි ඡන්ද 28 කින් පරාජය වන නිසා රහස් ඡන්දයට අපට යන්න බැහැ. ඒ නිසා ඔබතුමා ඉදිරිපත් කළ එම දෙවන යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීවරු නැගී සිටින්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, යෝජනාව සම්බන්ධව නොවෙයි. රීති අත්හිටුවීම සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ රීති අත්හිටුවීමේ යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීතුමාලා නැගී සිටින්න.

**ගරු ඒ.එම්. යුසුප්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ ඔබතුමා රීති අත්හිටුවීම පිළිබඳ ඡන්ද විමසීමක් කළේ නැහැ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා වෙනත් යෝජනාවක් ඉදිරිපත් කළා. එහෙනම් රීති අත්හිටුවීම එතැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමා ඉන් අනතුරුව ප්‍රකාශ කළා මේ සභාවට, ඡන්දයට පක්ෂව විපක්ෂව කියලා රීති අත්හිටුවීම පිළිබඳව මුල් කාලයේ විය යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවට රහස් ඡන්දයක් පවත්වනවාද නැද්ද යන්න – ඡන්දය විමසුවා නේ? ඊට එකඟ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වෙන අර්ථ නිරූපණ බැහැ. රීති අත්හිටුවීමේ යෝජනාව විතරයි එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පැහැදිලි කිරීමක් කරන්නම්. ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ? මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධය ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා අදහසක් ප්‍රකාශ කළා. ඒ අදහසට එතුමා එකඟ නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යෝජනාව ස්ථිර වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව ස්ථිර වුණා. ඒක හරි. නමුත් යෝජනාව විවාද කිරිමේදී ඡන්දයකට යන්න වෙනවා. එකඟතාවය මට අහන්න සිද්ධ වෙනවා. ඒකයි ඇහුවේ එකඟතාවය.

**ගරු යූ. ජෝර් පෙරේරා** – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙනම් මේ රීති අත්හිටුවීමේ යෝජනාව කියවන්න ඉස්සරවෙලා –

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාලා සැරින් සැරේ එක එක අදහස් ප්‍රකාශ කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

යෝජනාව ස්ථිර වෙන එකයි, සභා සම්මත වෙන එකයි දෙකක්. ඔයගොල්ලන්ගේ පැත්තෙන් යෝජනා ගෙනැල්ලා ස්ථිර කරලා සභා සම්මතයක් ගැන කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ගැන එක එක අර්ථ දක්වන්න පුළුවන් එක එක මන්ත්‍රිතුමාලාට. නමුත් එතුමා ගෙනාපු යෝජනාවට මම සභාවේ එකඟතාවය ඇහුවේ. එක එක අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. සභාපතිවරයා වශයෙන් මමත් උපරිමයෙන් උත්සාහ කරනවා සභාවේ ස්වාධීනව කටයුතු කරන්න. ඒ නිසා එතුමා ඉදිරිපත් කරපු යෝජනාවට මම සභාවෙන් ඇහුවේ, එම රිති අත්හිටුවීමේ යෝජනාවට එතුමා යෝජනා කළා රහස් ඡන්දයක් ඕනෑය කියලා. අපි එතැන්දි ඡන්දයට ගියා. දැන් රහස් ඡන්දයට බහුතරයක් විරුද්ධයි. ඒ නිසා අපට ඊළඟට තියෙන්නේ, ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාවට සභාව එකඟ නැති නිසා, ඒ යෝජනාව ගෙන ඒමට අවශ්‍ය රීති අත්හිටුවීමේ යෝජනාවට කැමැත්ත අකමැත්ත අපි විමසන්න ඕනෑ. ඒකයි දැන් මේ කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉඳලා 107 රීතිය යටතේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා කිව්වා. කිව්වාට පසුව ඒක මම ස්ථිර කළා. ස්ථිර කළාම මේ යෝජනාව සභා සම්මත වුණු යෝජනාවක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. සභා සම්මත වුණු යෝජනාවක් නොවෙයි. මන්ත්‍රීතුමා එක එක අර්ථ දක්වන්න එපා. සභා සම්මත වුණේ නැහැ. යෝජනාව විවාදයට ගිහිල්ලා ඉන් පස්සෙයි සභා සම්මත වෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයා ස්ථිර කරලා කොහොමද සභා සම්මත වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවදුරටත් මේ ගැන සාකච්ඡා කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකරලා ඔක්කෝම මන්ත්‍රීතුමාලා වාඩි වෙන්න. නිශ්ශබ්ද වෙන්න. කරුණාකරලා මෙම රීති අත්හිටුවීමේ යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීවරු නැගී සිටින්න. දිගින් දිගට මේ විධියට එක එක්කෙනාට අර්ථ දක්වන්න දෙන්න බැහැ. විවාදය ගැනීමට පක්ෂ මන්ත්‍රීවරු නැගී සිටින්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පැහැදිලිවම වැරදි අර්ථ නිරූපණයක් යන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැගී සිටින්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

නැහැ ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරපු අවස්ථාවේ ඔබතුමා රීති අත්හිටුවීම් පිළිබඳව ඡන්ද විමසීමක් කළේ නැහැ. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා වෙනත් යෝජනාවක් ඉදිරිපත් කළා. එහෙම නම් රීති අත්හිටුවීම එතැන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඔබතුමා ඉන් අනතුරුවත් ප්‍රකාශ කළා, මේ සභාවට, පක්ෂ විපක්ෂ ඡන්ද භාවිතා කරන්න ඕනෑය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඉතින් හරි නේ. ප්‍රශ්නයක් නැහැ නේ ඒක.

**ගරු ඒ.එම්. යූසුෆ්**

Hon. A M Yoosuf

හේතුව, න්‍යාය පත්‍රයට ඇතුළත් කරන යෝජනා වෙනුවට රීති අත්හිටුවීමේ යෝජනාව මුල් කාලයේදී ප්‍රමුඛතාව දිය යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ යෝජනාව දැන් සම්මත වුණා නේ මන්ත්‍රීතුමා.

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යෝජනාව ස්ථිර වුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ස්ථිර වුණාට විවාදයකට සම්මත වුණේ නැහැ නේ? සභාව එකඟ නැහැ නේ? සභාවේ එකඟතාවයක් නැහැ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

විපක්ෂ නායකතුමා කියන්නේ සභාව නොවෙයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩිවෙන්න. ඔබතුමා වාඩිවෙන්න.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සමාවෙන්න. අලුතින් යෝජනාවක් ඉදිරිපත් කළා.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

වෙන කථා බැහැ. වෙන අර්ථ නිරූපණ බැහැ. රීති අත්හිටුවීමේ යෝජනා විතරයි එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පැහැදිලි කිරීමක් කරන්නම්. ඔබතුමා වාඩිවෙන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේද? මුජිබර් රහුමන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අදහසක් ඉදිරිපත් කළා. ඒ අදහසට මන්ත්‍රීතුමා එකඟ නැහැ. ඒ නිසා මට -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

යෝජනාව ස්ථිර වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනාව ස්ථිර වුණා. නමුත් යෝජනාව විවාදයට ගන්න සභාවේ එකඟතාවය මට අහන්න සිද්ධ වෙනවා. ස්ථිර වුණු එක වෙනම දෙයක්. ඕනෑම දෙයක් ස්ථිර වෙනවා. නමුත් යෝජනාව විවාදයට ගැනීමේදී ඡන්දයකට යන්න සිද්ධ වෙනවා. එකඟතාවය අපට අහන්න සිද්ධ වෙනවා. ඒ නිසයි මම එකඟතාවය ඇහුවේ.

**ගරු යූ. ජෝර්  පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, එහෙම නම් මේ රීති අත්හිටුවීමේ යෝජනාව කියවන්න ඉස්සෙල්ලා එතුමාට තිබුණා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නැහැ. එහෙම ඔබතුමාලා මේ සැරින් සැරේ එක එක අදහස් ප්‍රකාශ කරන්න-

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

යෝජනාව ස්ථිර වෙන එකයි, සභා සම්මත වෙන එකයි දෙකක්. ඔබතුමන්ලාගේ පැත්තෙන් යෝජනා කරලා, ස්ථිර කරලා සභා සම්මතයක් ගැන කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මේක ගැන එක එක විධියට අර්ථ දක්වන්න පුළුවන් එක් එක් මන්ත්‍රීතුමන්ලාට. නමුත් එතුමා ගෙනාපු යෝජනාවට මම ඇසුවේ සභාවේ එකඟතාවයයි. එක් එක් අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා වැරැදි අර්ථ කථන දෙනවා. ඔය උගුලේ අහුවෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න මන්ත්‍රීතුමා. සභාපතිවරයා වශයෙන් මම උපරිම උත්සාහ කරනවා සභාවේ බොහොම ස්වාධීනව කටයුතු කරන්න. ඒ නිසා එතුමා ඉදිරිපත් කරපු යෝජනාවට මම සභාවෙන් ඇහුවේ, එම රීති අත්හිටුවීමේ යෝජනාවට මෙතුමා යෝජනා කළා රහස් ඡන්දයක් ඕනෑ කියන එක. අපි පළමුව ඒ ඡන්දෙට ගියා. දැන් රහස් ඡන්දයක් විමසනවාට මන්ත්‍රීවරු බහුතරයක් විරුද්ධයි. ඒ නිසා අපිට ඊළඟට තියෙන්නේ, ඔබතුමා ඉදිරිපත් කරපු යෝජනාවට සභාව එකඟ නැති නිසා ඒ යෝජනාව ගෙන ඒමට

කැමැත්ත අපි සභාවෙන් විමසන්න ඕනෑ. ඒක තමයි අපි අහන්න හදන්නේ. ඒකයි මේ දැන් කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉඳලා 107 රීතිය යටතේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න කිව්වා. කිව්වට පස්සේ ඒක මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ඉතින් ඒක තමයි යන මේ ක්‍රමය.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ස්ථිර කළාම මේ යෝජනාව සභා සම්මත වුණ යෝජනාවක්. එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නැහැ. සභා සම්මත වුණු යෝජනාවක් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

ගරු විපක්‍ෂ නායකතුමා, එක එක අර්ථ දක්වන්න එපා. සභාවේ සම්මත වුණේ නැහැ. සභාවේ සම්මත වෙන්නේ පස්සේ.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

විපක්ෂ නායකතුමා දන්නේ නැහැ සභා සම්මත වෙන්නේ මොකකද්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයට ගිහිල්ලා විවාදෙන් පස්සේ සභා සම්මත වන්නේ

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ඔබතුමා ස්ථිර කරලා කොහොමද සභා සම්මත වුණා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක එක අදහස් ප්‍රකාශ කරන්න එපා. මේ සභාව විහිළුවට ලක් කරන්න එපා.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

සභා සම්මතයයි ස්ථිර කිරීමයි දෙකක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එයා ස්ථිර කරලා සභා සම්මතයි කියලා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවදුරටත් මට සාකච්ඡාවට ඉඩ දෙන්න බැහැ. සභාව නිශ්ශබ්ද වෙන්න. කරුණාකරලා ඔබතුමා වාඩිවෙන්න. මේ පිළිබඳව එක එක්කෙනාට දිගින් දිගට අර්ථ දැක්වීම් කරන්න දෙන්න බැහැ. දැන් මම මෙම රීති අත්හිටුවීමේ යෝජනාවට ඡන්දය විමසනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

වැරැදි අර්ථ නිරූපණයක් යන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පැහැදැලිවම වැරැදි අර්ථ නිරූපණයක් යන්නේ.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 12 යි, විරුද්ධව 41 යි, වැළකුණු 02 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 12 for, 41 against and 02 decliners.*

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි මේ පළාත් සභා ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා ගෙනාපු යෝජනාව පරාද වෙලා තියෙනවා නම් ඒ සම්බන්ධව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා, ඒක වෙනම දෙයක් ඉතින්. ඔබතුමා මේ අදහස් ප්‍රකාශ කරන්න -

[සභාවේ ඝෝෂා ]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු විපක්ෂ නායකතුමා මොනවද අනේ කියවන්නේ බොරුවට. විපක්ෂ නායකතුමා වාඩි වෙන්න. ප්‍රශ්නය ඉවර නේ දැන්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ පළාත් සභාවෙන් අපි නික්ම යනවා.

**ගරු ලලිත් එල්ලාවල**

Hon. Lalith Ellawala

ඔය විපක්ෂ නායකතුමාට ට්‍රේනින් එකක් දෙන්න. විපක්ෂ නායකතුමා අලුතෙන් පත් වුණු හින්දා දන්නේ නැහැ. අලුත් මන්ත්‍රීවරයෙක් හින්දා විපක්ෂ නායකතුමා දන්නේ නැහැ මේක.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අද කීර්තිත් නැහැ විපක්ෂ නායකතුමාට කියලා දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

විපක්ෂ නායකකම වෙන කාටහරි දෙන්න.

[සභාවේ ඝෝෂා ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර හූ කීම් වලින් වලකින්න.

[සභාවේ ඝෝෂා ]

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක්ද තියෙන්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, මේක සම්පූර්ණ වැරදි පූර්වාදර්ශයක්. අපි මේ ක්‍රියාව කිසිසේත් අනුමත කරන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ඉදිරිපත් කළාට පස්සේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඔලුගෙඩි ගණන පදනම් කරගෙන යම් යෝජනාවක් විවාදයට ලක් කරන්න දෙන්නේ නැත්නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්ද ඔබතුමා යොමු කරන්නේ?

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒක අනාගතයට පූර්වාදර්ශයක් ලෙස ගන්න ඕනෑ නරකයි කියලා. අපේ ස්ථාවරය අපි ප්‍රකාශයට පත් කරන්නේ. මේ යෝජනාව විවාදයට ගන්නවාද නැද්ද කියන එක. යෝජනාවට පක්ෂ විපක්ෂ වෙන එක වෙනම කතන්දරයක්. නමුත් ඕනෑ මන්ත්‍රීවරයෙකුට තමන්ගේ යෝජනාවක් ඉදිරිපත් කරන්නට අයිතියක් තියෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම පිළිගන්නවා. ඔබතුමා වාඩි වෙන්න. එතුමා හරි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔයා කණ්ඩායම් නායකද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු සංවිධායකතුමා කරුණාකර නිශ්ශබ්ද වන්න. ඕනෑම මන්ත්‍රීවරයෙකුට මේ සභාවේ අයිතියක් තියෙනවා තමුන්ගේ කැමැත්ත අනුව යෝජනාවක් ඉදිරිපත් කරන්න. නමුත් අපේ මේ සභාවේ තියෙන සම්ප්‍රදායක් අනුව යෝජනාවට සභාවේ එකඟතාවය අපි අහනවා. බොහෝ දුරට රීති අනුව ඉදිරිපත් කිරීම සහ සභාවේ එකඟතාවය. ඒ අනුව දැන් සංවිධායකතුමා ඉදිරිපත් කරපු -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

වැරදි අර්ථ කථනයක් මේකේදී වෙන්නේ. මේ රීතිවලට අනුකූල නොවෙනවයි කියන පදනම මත තමයි මගේ අදහස් ප්‍රකාශ වෙන්නේ. රීතිවලට අනුකූල නොවෙනවයි කියන කාරණය. 107 කියන්නේ හදිසි කටයුත්තක් සඳහා. මේක හදිස්සි කටයුත්තක් නොවෙයි. ඒ නිසා තමයි අපි විරෝධතාවය පළ කළේ. ඒ පිළිබඳවයි ඡන්ද විමසීමට ගියේ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ නැහැ. ඒ හදිසිද නැද්ද කියලා ඔබතුමාලගේ පැත්තෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ඔබතුමාලට විවාදයට යන්න දෙන්න බැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

නමුත් මේ රටේ තියෙන දේශපාලන තත්ත්වය අනුව දැන් මේ යෝජනාව හදිස්සියේ එනවා. 13 වන සංශෝධනය ආවේ හදිස්සියේ නොවෙයිද? සාකච්ඡා කරලා නොවෙයිද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එහෙම ආවොත් පුළුවන්. එහෙම රජයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නැහැ විවාදයට යන්න බැහැ. අපි නිශ්ශබ්ද වෙමු.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ආණ්ඩුවේ ඉහළම තැනින් කියලා තිබෙනවා මේක අහෝසි කරනවා කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැහැ එහෙම දෙයක් නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ වෙනුවෙන් ආණ්ඩුවේ පක්ෂ රැස්වීම් තියද්දී -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ආණ්ඩුවේ පක්ෂවලට පුළුවන්. වෙනත් දේශපාලන පක්ෂවලට පුළුවන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා මේක හදිසියේ එන්න පුළුවන්. පළාත් සභා ක්‍රියාත්මක වන සති දෙක තුන ඇතුළතත් මේක එන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව සලකන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩි වෙන්න. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ පළමුවැනි යෝජනාව ඉදිරිපත් කිරීමට තිබෙන්නේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට. එතුමිය මේ සභා ගර්භයේ නොසිටින නිසා එම යෝජනාව අහෝසි වෙනවා.

***න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා (XI) යටතේ අංක I ලෙස තිබූ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් යුත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමට නම කැඳවූයෙන්, ගරු මන්ත්‍රීතුමිය සභා ගර්භයේ නොසිටි බැවින් එකී යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් වන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.***

*Hon. Member in the Chair called for the name of Hon. Member Rose Fernando in order to present the Private Member motion No. I under No. (XI) of the Agenda which was under his name, and due to the absence of the Hon. Member in the Council Chamber at that time, Hon. Chairman that the said motion is removed from the Agenda*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවන යෝජනාව ඉදිරිපත් කිරීමට තිබෙන්නේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාට අවස්ථාව එම යෝජනාව ඉදිරිපත් කිරීමට.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, -

**ගරු නිහාල් ජයවර්ධන**
Hon. Nihal Jayawardana

ගරු සභාපතිතුමා, මන්ත්‍රීතුමෙක් මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරලා, එතුමා මෙතැන පෙනී හිටින්නේ නැහැයි කියන්නේ, එයාව පත් කරපු ජනතාවට කරන ලොකු අසාධාරණයක්. බස්නාහිර පළාත් සභාවේ ජනතාවට කරන අසාධාරණයක්. එයා එයාගේ යුතුකම ඉෂ්ට කරලා නැහැ.

[සභාවේ ඝෝෂා ]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

# බස්නාහිර පළාත තුළ පිහිටා ඇති කඩ සාප්පු, හෝටල්, වෙළඳ සැල්වල, රජයේ විවිධ ආයතනවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වැටුප් සහ ඔවුන්ට හිමි සෙසු වරප්‍රසාද විධිමත් කොට ලබා දීම
REGULARIZING THE SALARIES AND OTHER PRIVILEGE-RIGHTS OF EMPLOYEES SERVING IN BOUTIQUES, SHOPS, HOTELS AND SALES CENTERS OF WESTERN PROVINCE AND CONFERRING THEM WITH SUCH

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මම මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ සංශෝධන සහිතව.

*"බස්නාහිර පළාත තුළ කඩ සාප්පු, හෝටල් හා වෙළඳ සැල්වල ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සේවයේ යෙදෙන අතර, එම සේවක සේවිකාවන්ට නිසි වැටුපක්, අර්ථ සාධක අරමුදල්, පාරිතෝෂික, නිවාඩු අතිකාල දීමනා විධිමත් ආකාරයෙන් නොලැබෙන බැවින්, එම සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කර දීම, අවම වැටුපක් නිර්ණය කිරීම ඇතුළු ඔවුන් මුහුණ දෙන එම ගැටළු හඳුනා ගෙන එම ගැටළු විසඳීම සඳහා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කළ යුතු බවටත්, එම නිර්දේශ අනුව විසඳුම් ලබා දීමට ක්‍රියා කළ යුතු බවටත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයේ කම්කරු අමාත්‍යාංශය වෙත යෝජනා කරන අතර, රජය යටතේ ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, සංස්ථාපිත මණ්ඩල ආදී සිය ආයතනවල කොන්ත්‍රාත්කරුවන් යටතේ හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයන්ද ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස යෝජනා කර සිටින්නීය."*

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉදිරිපත් කළ යෝජනාවට එතුමාම සංශෝධනයක් ඉදිරිපත් කළා. ඒ සංශෝධිත යෝජනාව කවුරු හරි මන්ත්‍රීවරයෙක් ස්ථිර කරන්න.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

***[විසින් සංශෝධිතාකාරයෙන් ස්ථිර කරන ලදී.]***
*[Seconded with amendments]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තියෙනවා.

[ අ.භා. 12.15 ]

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ස්තුතියි ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව තුළ කඩසාප්පු, හෝටල්, සංචාරක ව්‍යාපාරය ආදී රජයට සම්බන්ධ නොවන නොයෙකුත් පෞද්ගලික ආයතන රාශියක් තියෙනවා. මම හිතන්නේ මේ පළාත් සභාව තුළ පමණක් දශ ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් මෙම සුළු සාප්පු ආදී තැන්වල රැකියා කරනවා. මම හිතන්නේ, රජයට බරක් නොවී මේ කඩසාප්පු හෝටල් ආදී ස්ථානවල රැකියාව කරන මේ සේවකයන්ට නිසි නිවාඩුවක්, නිසි වැටුපක්, රක්ෂණ ආවරණයක්, එවැනි දේවල් කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. මේ අයට නිසි අර්ථසාධක අරමුදලක්, පාරිතෝෂිකයක්, අතිකාල දීමනා කිසිම දෙයක් ලැබෙන්නේ නැහැ. මේ නිසා අපි දිගින් දිගටම පහුගිය අයවැය යෝජනාවලදී මුදල් අමාත්‍යාංශයට, අතිගරු ජනාධිපතිතුමාට, කම්කරු අයිතීන් ආරක්ෂා කරන්නයි කියලා නොයෙක් යෝජනා ගෙනාවා. මැයි දිනයේදී විරෝධී යෝජනා ගෙනාවා. මෙලෙස මේ අහිංසක මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න, රැකියා සුරක්ෂිත කරන්න කියන යෝජනා නොයෙක් ආකාරයෙන් අපි මුදල් අමාත්‍යාංශයට ගෙනාවා. පහුගිය වතාවෙත් මේ යෝජනාව මම පෞද්ගලිකව ඉදිරිපත් කළා, මේ අයට නිසි ක්‍රම වේදයක් හදන්නය කියලා. අපේ ජනාධිපතිතුමා කම්කරු ඇමතිවරයෙක් වශයෙන්, කම්කරු නායකයෙක් වශයෙන් මේ රජය ගෙනයන වෙලාවේ එතුමාගේ කාලේදීවත් මේ අයට මෙහෙම සහනයක් මෙතෙක් දෙන්න බැරි වීම මම හිතන්නේ, අපි ඉතාමත් කනගාටු විය යුතු කාරණයක්. විශේෂයෙන්ම ජනාධිපතිතුමා සමහර වේලාවට මේවා මුදල් අමාත්‍යාංශයට යොමු කළා. මුදල් අමාත්‍යාංශයේ අපේ මුදල් ලේකම්වරයා, කනගාටුයි කියන්න, හිට්ලර්ට වඩා හපන් හිට්ලර් කෙනෙක් වගේ තමයි එතුමා ක්‍රියා කරන්නේ. මේ කිසිම යෝජනාවක් ගණන් ගන්නේ නැතුව එතුමාට ඕනෑ දේවල් කරනවා. සමහර වේලාවට පහුගිය වකවානුවල අපි දැක්කා මිනිස්සු මේ විශ්‍රාම වැටුපක් ඕනෑ නැහැය, එපායි කියද්දී බලෙන් විශ්‍රාම වැටුප් පටවන්න යනවා. විශ්‍රාම වැටුප් එපාය කියන අයට විශ්‍රාම වැටුප් දෙනවා. මේ අන්ත අහිංසක මිනිස්සු වෙනුවෙන් කිසිම දෙයක් මේ වන විට කරලා නැහැ. විශේෂයෙන්ම මේ අය, කඩ සාප්පුවල ඉන්න සේවකයෝ ඉතාමත් අසරණ තත්ත්වයක ඉන්නේ.

විශේෂයෙන්ම වැඩට ගන්නවා නම් ඒ අයට අවුරුදු පහක් යනකල් බඳින්න බැහැ. බැන්දත් අවුරුදු පහක් විතර යනකල් ළමයි හදාගන්න පුළුවන්කමක් නැහැ. සේවයට ගන්නේ එසේයි. සියලුම අයට ඒ සේවා වැඩමුරය ආරක්ෂා කර තිබෙනවා, දිවංගත අපේ කම්කරු නායකයා. නමුත් මේ සේවකයන්ට ඒ පැය 8 වැඩ මුරයක් නැහැ. උදේ හයට ආවහම රෑ 9, 10, 11, 12 වෙනකල්ම ඒ අය සේවය කරනවා. ඒ අයට ඒ වෙනුවෙන් අතිකාල දීමනාවක් ලැබෙන්නේ නැහැ. ඒ අයට සමහර වෙලාවට මේ රස්සාව කරනවා නම් ලැබෙන්නේ, ඒ හාම්පුතුන්ව හුරතල් කිරීම තමයි මේ සේවිකාවන්ට උරුම වෙලා තිබෙන්නේ. එසේ අකැමැති අය පහුවදා ඉඳලා දොට්ට. ඒ අයට හාම්පුතුන් කරන දේවල් විඳ දරා ගන්න බැරි නම්, ඒවාට එකඟ වෙන්නේ නැත්නම් පහුවදා ඉඳලා ඒ අයව රස්සාවෙන් දොට්ට දමන්න කටයුතු කරලා තිබෙනවා. මෙවැනි පැමිණිලි ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් මේ ලංකාව පුරා තිබෙනවා. වැඩිම කඩ සාප්පු ප්‍රමාණයක් තිබෙන්නේ, මේ බස්නාහිර පළාත් සභාව තුළ. වැඩිම හෝටල් ප්‍රමාණයක් තිබෙන්නේ, බස්නාහිර පළාත් සභාව තුළ. නමුත් පළාත් සභාවක් වශයෙන් අපි මේ අය වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? මේ අයගේ රැකියා සුරක්ෂිතභාවය වෙනුවෙන්, මේ අයගේ පැය 8 වැඩ මුරය වෙනුවෙන්, මේ අයගේ අතිකාල දීමනා ලබා දීම වෙනුවෙන් අපි මෙතෙක් ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. අපි අවාසනාවට නැවත වතාවක් සිහිපත් කරන්න ඕනෑ. මේ රජයටත් අපි කොතරම් යෝජනා ඉදිරිපත් කළත්, මේ ගැන අවධානයක් යොමු කළේ නැහැ.

මම හිතන්නේ මේක බේදවාචකයක්. විවාහ වෙලා අවුරුදු 05 යනකල් තමුන්ට දරුවෙක් හදා ගන්න බැරුව සේවයට යන්න වෙනවා නම්, දරුවන් හදා ගත්තාට පස්සේ ළමයින් නිසා නැවත ඒ රැකියාවට යන්න බැරි වෙනවා නම්, තමන්ට තමන්ගේ වැඩ මුරයට අමතරව කරන අතිකාලය වෙනුවෙන් අතිකාල දීමනා ලැබෙන්නේ නැත්නම් මේක මහ බේදවාචකයක්. ඒකයි අපි මේ පුන පුනා කියන්නේ. මේ බස්නාහිර පළාත් සභාව මේ සඳහා මැදිහත් වෙලා කමිටුවක් පත් කරලා, මෙසේ සේවය කරන පාරිතෝෂික, අතිකාල නොලැබෙන සේවකයන්, මෙසේ සමාජ අසාධාරණයට පත් වුණු කම්කරු නීති යටතට නොගැනෙන මේ රටේ ජන ජීවිතය ගෙන යන මේ අසාධාරණයට පත් වුණු සේවක සේවිකාවන් වෙනුවෙන් මීට වඩා වැඩි යමක් පළාත් සභාව වෙනුවෙන් කළ යුතුයි කියලා යෝජනා කරනවා. ඒකයි අපි මහ ආණ්ඩුවට මේ යෝජනාව තල්ලු කරන ගමන් ඒ අයට මේ යෝජනාව යොමු කරන ගමන්, මේ පිළිබඳව අපේ පළාත් සභාව මීට වඩා සක්‍රීයව දායක වෙලා මේ අය ගැන නිසි සමීක්ෂණයක් කරලා කොපමණ සංඛ්‍යාවක් එසේ ඉන්නවාද? ඒ අයට මොකක්ද කරන්න පුළුවන්. අඩුම වශයෙන් ඒ අයට මේ පළාත් සභාවෙන් රක්ෂණාවරණයක්වත් දෙන්න පුළුවන් නම් ඒ ලබා දෙන්න පුළුවන් දේ ලබා දීලා ඊට අමතරව අපේ ප්‍රධාන ආණ්ඩුවට මේ යෝජනාව ඉදිරිපත් කරලා, ඒ අයට සහනයක් සලසා දෙන්න කියන යෝජනාව තමයි අපි ඉදිරිපත් කරන්නේ.

විශේෂයෙන්ම නැවත වතාවක් මම මතක් කරන්න ඕනෑ. මම අලුතින් එක් කිරීමක් කරලා අවසන් මොහොතේ මගේ යෝජනාව සංශෝධනය කරන්න වුණා. ඒ නිසා මම මේ යෝජනාවට අලුතින් එකතු කළේ, මේ සංශෝධන යෝජනාවේ රජය යටතේත් විශාල ආයතන ප්‍රමාණයක කොන්ත්‍රාත්කරුවන් යටතේ සහ අමාත්‍යාංශ යටතේම කොන්ත්‍රාත් පදනමේ අවුරුදු ගණනාවක් වැඩ කරන උදවිය සිටිනවා. විශේෂයෙන්ම, කොන්ත්‍රාත්කරුවන්ට අවුරුදු 15, 20 තෙක් කොන්ත්‍රාත් එක ලබා දෙන්නවා. ඒ කොන්ත්‍රාත්කරුවෝ තමයි මේ සේවකයෝ බඳවාගෙන රජයේ ආයතනවලට යොමු කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම සංස්ථාපිත මණ්ඩලවල, බැංකුවල මෙලෙස සේවක කරන සේවකයෝ විශාල ගණනාවක් සිටිනවා. රජයෙන් රුපියල් 800 ක් විතර කොන්ත්‍රාත්කරුවාට ගෙවනවා. ඒ සේවකයන්ට ලැබෙන්නේ රුපියල් 400 ක වාගේ ප්‍රමාණයක්. භාගයක් ගසා කනවා. මේවාට බෙදන්නේ කෙසේද කියලා ඇහුවාම අපට කොන්ත්‍රාත්කාර මහත්වරු කියන්නේ, සේවකයෙකුගෙන් අපට රුපියල් 100 ක් වාගේ තමයි තියෙන්නේ. රුපියල් 300 බෙදනවා වෘත්තීය සමිතිවලට. කනගාටුයි කියන්න. වෘත්තීය සමිතිවලටත් බෙදනවා. අදාළ නිලධාරීන්ට බෙදනවා. මෙලෙස බෙදිලා තමයි මේ කටයුත්ත කෙරෙන්නේ කියලා ඒ කොන්ත්‍රාත්කාර මහත්වරු කියනවා. පුදුමය කියන්නේ අවුරුදු 15, 20 මේ අයමයි කොන්ත්‍රාත් එක ගන්නේ. ඒ යටතේ මේ අයමයි වැඩ කරන්නේ. මේක හරි අවාසනාවන්ත සිද්ධියක්. උදාහරණයක් වශයෙන් සමහර ආයතනවල අවුරුදු 20 වැඩ කරන අය ඉන්නවා. මේ අයට රුපියල් 400 ගණනේ දවස් 30 ක් වැඩ කළොත් මාසයකට රුපියල් 12,000 ක් ගසා කනවා. අවුරුද්දක් වැඩ කළොත් 144,000 යි. අවුරුදු 20 ක් වැඩ කළොත් 2,880,000 ක මුදලක් එක සේවකයෙකුගෙන් තමන්ගේ ජීවිත කාලයේදී මේ අතරමැදියෝ සූරා කනවා. මේක හරියට වහල් සේවය වාගේ. මේ රටේ කම්කරු නායකයෙක් රජ කරන වෙලාවේ වහල් සේවය වාගේ සේවයක් ලෙසට සේවය කරමින් මේ කොන්ත්‍රාත්කරුවන් යටතේ වැඩ කරන සේවකයෝ සිටීම කනගාටුවට කරුණක්. ඒ අයගේ අයිතිවාසිකම් සියල්ල උල්ලංඝණය වෙලා තිබෙනවා.

ඒ නිසා අපි විශේෂයෙන්ම නැවතත් කියන්නේ, මේ අයගේ සේවක අයිතිවාසිකම් ආණ්ඩුවත් ආරක්ෂා කරන්න ඕනෑ. ආණ්ඩුවේ ආයතනවල මෙවැනි සේවකයින් සිටීම බරපතළ බේදවාචකයක්. ඒ අයට වැටුප් වෙන් කරලා මේවා කොන්ත්‍රාත්කරුවන්ට දෙනවා. මේ කොන්ත්‍රාත්කරුවන් හරහා නිලධාරීන්ට, වෘත්තීය සමිතිවලට සහ සමහර දේශපාලඥයන්ගේ සාක්කුවලට මේ මුදල් යනවා. මෙලෙස මේ ක්‍රම වේදය දිගින් දිගට ගෙන යාම, අපේ වාගේ වාමාංශික රජයක් රජ කරන වෙලාවේ කිසිසේත් සුදුසු නැහැයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ වහල් වෙළඳාම නැවැත්වීම සඳහා මේ අයවැයෙන්වත් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මේවා නවත්වන්න පුළුවන්. අලුතෙන් වැටුප් දෙන්න මුදල් වෙන් කරන්න උවමනාවක් නැහැ. මේ මුදල අයවැයෙන් වෙන් කරලා කොන්ත්‍රාත්කරුවන් අතට දෙනවා. අපි කියන්නේ එය නවත්වලා අදාළ ආයතනයට ඒ මුදල වෙන් කරලා ඒ මුදලින් මේ වැඩ කරන සේවකයන්ගේ අර්ථ සාධක ගෙවන්න. සේවය ස්ථිර කරන්න. ඒ අයට විශ්‍රාම වැටුපක් නම්, ඒ විශ්‍රාම වැටුප සඳහා මුදල් වෙන් කරන්න පුළුවන්. එසේ හැකියාව තිබියදී මෙසේ අතරමැදියන් ගසාගෙන කෑමට ඉඩ දීම, දිගින් දිගටම අවුරුදු 15 ක් 20 ක් තුළ මෙසේ කිරීමට ඉඩ දීම ඉතාම බරපතළ බේදවාචකයක්. පළාත් සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට මේ ගෞරවය අත් වෙනවා. මේ පළාත් සභාව තුළ අපි සියලු දෙනා එකා වාගේ මේ අහිංසක මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටලා ඒ අයගේ සේවය ස්ථිර කරන්න අවස්ථාව ලබා දීලා ඒ අයට තිබෙන මේ දුක් ගැහැට නිමා කරන්න සියලු දෙනා එකතු කරලා අත්වැල් බැඳගෙන රටක් වශයෙන් මේ රටට දාඩිය හෙලන, දාඩිය වගුරන මේ අහිංසක මිනිසුන්ගේ ජන ජීවිත උසස් කරන්න පුළුවන් සෑම ක්‍රියා මාර්ගයක් සඳහාම තමුන්නාන්සේලා සියලු දෙනා අපි මන්ත්‍රීවරු වශයෙන්, පළාත් සභාව වශයෙන් මෙයට දායක වෙලා මේ පෞද්ගලික ආයතනවල ඉන්න අනාරක්ෂිත සේවකයන්ගේ සහ අපේ රජයේ ආයතනවල දීර්ඝ කාලයක් කොන්ත්‍රාත්කරුවන් යටතේ සහ කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන අයගේ සේවය ස්ථිර කරලා මේ අයටත්, අනෙක් රජයේ සේවකයන්ටත්, පෞද්ගලික ආයතනවල ඉන්න අනෙක් සේවකයන්ට හිමි සාධාරණ වැටුප, අතිකාල දීමනාව සහ පාරිතෝෂික ඇතුළු අනෙක් අයට ලබා දෙන සියලු දීමනාවල වරප්‍රසාද භුක්ති විඳීමේ අයිතිය ලබා දෙන්න කියන එකයි අපි පුන පුනා කියන්නේ. ඒ නිසා මේ යෝජනාව

සංශෝධන සහිතව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.24 ]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් තමයි මේ සභාවට ඉදිරිපත් කළේ. අපි විශ්වාස කරනවා එතුමා ඒ ඉදිරිපත් කරපු යෝජනාව මේ රටේ බලධාරීන්ගේ අවධානයට ඉතාම ඉක්මණින් යොමු වෙයි කියලා. අපි දන්නවා ගරු සභාපතිතුමනි, සමාජයක් සංවර්ධනය වෙලා ඉස්සරහාට යද්දී අපි පසු කරගෙන ආපු සමාජ අවධීන් කිහිපයක් තිබෙනවා. එකක් තමයි වහල් සමාජය අපි පසු කරගෙන ආවා. ඊට පස්සේ වැඩ වසම් සමාජයත් පසු කරගෙන ආවා. හැබැයි, මේ සමාජය දිහා අපි ආපහු හැරිලා බලද්දී අපට පෙනෙන්නේ, අපි නැවතත් වහල් සමාජය හරහා ගමන් කරනවාද කියන ප්‍රශ්නය තමයි අප ඉස්සරහා තිබෙන්නේ. දැන් පසුගිය දවසක මම බයිසිකලයට පෙට්‍රල් ටිකක් ගහගන්න පෙට්‍රල් ෂෙඩ් එකට ගියා. ඒ ගියාම පෙට්‍රල් ෂෙඩ් එකේ ඉන්න මනුස්සයා කියනවා, ඔබතුමා මන්ත්‍රී කෙනෙක් කියලා මම දන්නවා. නමුත් ඔබතුමන්ලාවත් අපි ගැන කථා කරන්නේ නැහැයි කියලා පෙට්‍රල් ෂෙඩ් එකේ පෙට්‍රල් පොම්පකරුවා කියනවා. එතකොට මේ වාගේ දහස් ගණනක් සේවකයන් ඉන්නවා, තමන්ගේ සේවය ඉතාමත් අනාරක්ෂිත සේවාවන් සපයන අය ලෙස. ඒ වාගේම තමයි තවත් ඉන්නවා රියැදුරන්. රියැදුරන් කියනවා, විශේෂයෙන් ඇමතිවරුත් එක්ක මන්ත්‍රීවරුත් එක්ක යන අයට වැඩ කිරීමේ කාල සීමාවක් නැහැ. පසුගිය දවසක BMICH එකේ සම්මන්ත්‍රණයක් තිබුණා. ඒ සම්මන්ත්‍රණයට පොලීසියේ රියැදුරන්ට අඩු ගාණේ තේ එකක්

[ ගරු සරත් පතිරණ ]

බොන්න තැනක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ තිබුණේ නැහැ. තේ එකක් බොන්න වටේ ඇවිදිද්දී මමත් එතැනට වෙන කටයුත්තක් සඳහා යද්දී තමයි අහන්නේ, මේ කිට්ටුව තේ එකක් බොන්න තැනක් නැද්ද කියලා. ඒ වාගේ ඉතාමත් අසාධාරණ විධියට ඒ ශ්‍රමය සූරා කෑමට ලක් වන සේවකයින් දහස් ගණනක් ඉන්නවා. සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා දන්නවා. ගරු සභාපතිතුමනි, මෑන් පවර් ආයතනවලින් සපයා ගන්නා සේවාවන්වලින් ඉතාමත් පහත් විධියට, ඉතාමත් ම්ලේච්ඡ විධියට ශ්‍රමය සූරා කන බව. මේ සමාජය මම මුලින් කිව්ව වහල් සමාජයක් බවට පත් වෙමින් තිබෙන සමාජයක් බවට මේ සමාජය ආපස්සට ගමන් කරමින් තිබෙනවා. මෙන්න මේක තමයි ප්‍රශ්නය. සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා මේක කොයිතරම් රජයට කිව්වත්, මේක ධනපති රජයක් නිසා, ධනපතීන් සුරක්ෂිත කරන රජයක් නිසා මම විශ්වාස කරනවා, දේශපාලනය පිළිබඳ එතුමාටත් යම් අවබෝධයක් තිබෙනවා කියලා. මේ ධනපති ක්‍රමය සහතික කරන ඒ සඳහා වැඩ කටයුතු සලසා දෙන, ධනපතියන් සුරකින රජයකින් අපට බලාපොරොත්තු වෙන්න බැහැ මේ කියන සේවාවන් ටික, මේ කියන පහළ කම්කරුවන්ට ඉෂ්ට වෙයි කියලා.

ඒ නිසා දැන් මේ සමාජය අර මම කිව්ව වහල් සමාජය දක්වා ගමන් කරමින් තිබෙනවා. අන්න එතැන වෙනස් කර ගැනීම සඳහා තමයි දැන් අපි රටක් හැටියට සමාජයක් හැටියට අපට ඉස්සරහා තිබෙන අභියෝගය. මේ වහල් සමාජය කරා ගමන් කරන මේ ගමන නතර කළ යුතුයි. ඒ ගමන නතර නොකළොත් දැන් මේ සමාජය එතැනිනුත් පස්සට ගිහිල්ලා ම්ලේච්ඡත්වය කරා ගමන් කරනවා. අපි දැකපු ගෝත්‍රික සමාජය, ප්‍රාථමික සාමූහික සමාජයේ ලක්ෂණත් දැන් ඉස්මතු වෙමින් තිබෙනවා. මව පියා හඳුනන්නේ නැහැ. ඒ වාගේම සහෝදර සහෝදරියන් හඳුනන්නේ නැහැ. සමාජ සම්බන්ධතා සියල්ල බිඳ වැටෙමින් තිබෙනවා. විශේෂයෙන් ආසියාතික සමාජයේ අපත් එක්ක තිබුණු ඒ මානව බැඳීම් මානව ධර්මතා ඒ සියල්ල බිඳ වැටෙමින් ම්ලේච්ඡත්වය කරා මේ සමාජය ගමන් කරමින් තිබෙනවා. ඒ කැල්ලෙන් කෑල්ල, කැල්ලෙන් කෑල්ල ප්‍රශ්නවලට උත්තර හොයන්න බැහැ ගරු සභාපතිතුමනි.

ඒ නිසා මුළු සමාජයක් විධියට, මුළු රටක් විධියට මෙන්න මේ තත්ත්වයන්ගෙන් පීඩාවට පත් වන හැම ක්ෂේත්‍රයකම නියෝජිතයන්, විශේෂයෙන්ම මෙන්න මේ ගැන කල්පනා කරලා මේ අය සියල්ල එක මිටකට එකතු වෙලා මෙන්න මේ සඳහා, අපව පාගන, අපව පීඩාවට පත් කරන, අපව පෙළන මේ සමාජ ක්‍රමය වෙනස් කර ගැනීමේ කාලය තමයි මේ එළැඹිලා තිබෙන්නේ. ඒ සඳහා තමයි දැන් මේ සමාජය සූදානම් විය යුත්තේ. නැත්නම් පෙට්‍රල් ෂෙඩ් එකේ සේවකයාට තමන්ගේ අයිතිවාසිකම් දිනා ගන්න, ඇඟළුම් ක්ෂේත්‍රයේ ඉන්න සේවක සේවිකාවන්ට තමන්ගේ ප්‍රශ්න තමන් විසින්ම පෞද්ගලිකව තම ක්ෂේත්‍රය තුළ විසඳගන්න, එහෙම නැත්නම් හෝටල් සේවකයන්ගේ ප්‍රශ්න ඒ ක්ෂේත්‍රය තුළ ඒ අයට විතරක් මේ ප්‍රශ්නය විසඳා ගන්න දැන් කාලය පහු කරලා හමාරයි. එය ඉෂ්ට කර ගත හැකි කාලයක් තිබුණා. නමුත් දැන් මේ සමාජය ගමන් කරමින් තිබෙන්නේ, ඒ සමාජ අවධිය පසු කරමින්.

අපි දන්නවා. පසුගිය දවසක මම දැක්කා ගරු සභාපතිතුමනි, ඇමතිවරයෙකුගේ පුතෙක් ගැන පත්තරේ සම්මුඛ සාකච්ඡාවක් තිබුණා. සමහර මල් පත්තරවල සම්මුඛ සාකච්ඡා තිබෙනවා නේ? ඒ සාකච්ඡාවේ තිබුණා, ඒ ඇමතිවරයාගේ පුතා පාවිච්චි කරන වාහනය. මට ඒ වාහන වර්ගය නම් මතක නැහැ. ලංකාවට ඒ වාහන දෙකයි ගෙනැල්ලා තිබෙන්නේ. ඒ තාරුණ්‍යයට හෙටක් හදන හැටි. තරුණයන් ගැන මේ ආණ්ඩුව බලන හැටි. ඇමැතිවරු පුත්තු ගැන ඉතාමත් හොඳින් බලලා තිබෙනවා. වාහනයේ වත්මන් වටිනාකම ලක්ෂ 400 යි. ඔහු ගෙන්නද්දී ලක්ෂ 300 ට ගෙන්වාගෙන තියෙන්නේ. ලංකාවට දෙකක් තිබෙන එහෙම ලක්ෂ 400 වාහන පාවිච්චි කරන්න ඇමැතිවරුන්ට ඒ වරප්‍රසාදය තියෙද්දී, අද පෙට්‍රල් ෂෙඩ් එකේ තරුණ දරුවා,

ඒ වාගේම අනෙක් පැත්තෙන් සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා කියන හෝටල් සේවක සේවිකාවන්, පෞද්ගලික ආයතනවල රැකියා කරන සේවක සේවිකාවන් මොන තරම් දුෂ්කර තත්ත්වයන් යටතේ ජීවත් වෙනවාද කියලා අපි දන්නවා. දැන් ඒ ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයාගෙන් ඉස්මතු වුණු කාරණාවලින් පෙනෙනවා. ලක්ෂ 400 සුපිරි වාහන පාවිච්චි කරද්දී, සමාජ ශාලාවල රාත්‍රිය ගත කරද්දී, එක් සමාජ ශාලාවකට ඇතුළත් වීමේ ගාස්තුව පමණක් - ඒ කියන ඇමැතිවරයාගේ පුතාට ඕනෑම සමාජ ශාලාවකට යන්න පුළුවන්ලු. ඔහු ඒකේ සාමාජිකයෙක්. මා දන්නා තරමින් සාමාන්‍යයෙන් කොළඹ නගරයේ තිබෙන සමාජ ශාලාවක ඒ සාමාජිකත්වය ගැනීමට පමණක් ලක්ෂ 1 1/2 ක් ගෙවන්න ඕනෑ. මෙවැනි සුඛෝපභෝගී ජීවිත ගත කරමින් ගෙවෙන තරුණ ජීවිත සහ ඉතාමත්ම පහත් විධියට ජීවත් වන ඒ වාගේම සමාජයේ නොසැලකිල්ලට ලක් වන, සමාජයේ අවධානයට ලක් නොවුණු තරුණ පරම්පරාවකුත් මේ සමාජය කෙරෙහි වෛරයකින් පෙළෙමින් මේ මොහොත් පසු වෙනවා. අපට ඒ පෙට්‍රල් ෂෙඩ් එකේ සේවකයාගෙන්, ඇඟළුම් කර්මාන්ත ශාලාවේ සේවක සේවිකාවන්ගෙන් ඒ වාගේම අනෙකුත් ක්ෂේත්‍රයන්ගේ සේවක සේවිකාවන්ගෙන් දැන් මතු වෙමින් තිබෙනවා, මේ සමාජය අපට සලකන්නේ නැහැ. තාරුණ්‍යයට හෙටක් හදනවා කියලා ඡන්ද ගත්තු මන්ත්‍රීවරු අද ඇමැතිවරු බවට පත් වෙලා තිබෙනවා. තවත් ඉහළට යන්න බලාපොරොත්තුවෙන් ඉන්න ඒ තාරුණ්‍යයට හෙටක් හදන ඒ මන්ත්‍රීවරුන්ට දැන් කාලය එළැඹිලා තිබෙනවා. අඩු ගාණේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයවත් සොයා බලලා පීඩාවට පත් වන මේ සමාජය කෙරෙහි තමන්ගේ ඒ හෙටක් හැදීමේ කාර්ය එළැඹිලා තිබෙනවා කියන කාරණය මතක් කරනවා ගරු සභාපතිතුමනි. අපි දන්නවා. දැන් දිනකට 11 දෙනෙකු සිය දිවි හානි කර ගන්න සමාජයක් බවට අපේ සමාජය පත් වෙමින් තිබෙනවා. දිනකට 11 දෙනෙක් සිය දිවි හානි කර ගන්න රටක් අපේ ලංකාව. ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා එදා හඳුන්වපු, ඒ වාගේම වෙනත් වෙනත් අර්ථ කථනයන් දීපු මේ සමාජය දැන් දිනකට 11 දෙනෙක් සිය දිවි හානි කර ගන්න සමාජයක් බවට පත් වෙමින් තිබෙනවා. මේ සියලු කාරණා සලකා බලලා අපි හැමෝගෙම වගකීමක් තිබෙනවා, මෙන්න මේ තත්ත්වයන්ගෙන් මේ සමාජය වෙනස් කර ගන්න. පීඩාවට පත් වන හැම කෙනෙකුටම සාධාරණය ඉෂ්ට වන සමාජයක් නිර්මාණය කරගත යුතුයි. ඒ සඳහා කාලය එළැඹිලා තිබෙනවා කියන කාරණය මතක් කරමින් මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තූතිය පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.30 ]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. අප හිතවත් සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා අද ඉතාමත්ම වැදගත් යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා කියලයි අපි විශ්වාස කරන්නේ. විශේෂයෙන්ම හෝටල් ක්ෂේත්‍රය ඒ වාගේම කඩ සාප්පු මෙවැනි ක්ෂේත්‍රයේ වැඩ කරන සේවකයින් මේ රටේ ලක්ෂ 10 කට වැඩි ප්‍රමාණයක් සිටිනවාය කියන එක තමයි අපේ විශ්වාසය වෙන්නේ. පෞද්ගලික අංශයේ මුළු ශ්‍රම බලකාය වන දස ලක්ෂ 10 ක පමණ ප්‍රමාණයෙන් 60% ක පමණ ප්‍රමාණය අද වැඩ කරන්නේ ස්ථිර ගණයේ නොවන, නියම අයිතිවාසිකම්වලට හිමිකම් නොකියන සේවකයින් හැටියට තමයි මේ අතිවිශාල සේවක පිරිස මේ ක්ෂේත්‍රයේ වැඩ කරන්නේ. විශේෂයෙන්ම මෙම කඩ සාප්පු, ඒ වාගේම මෙවැනි හෝටල්වලට බඳවා ගන්න සේවකයින්, කිසිම පත්වීම් ලිපියක් හෝ වෙනත් කොන්දේසියක් ඇතුව බඳවා ගන්න අය හැටියට නොවෙයි සේවයේ යොදවා ගන්නේ. බොහෝ අවස්ථාවල නිකම් අනියම් මට්ටමින්, එහෙමත් නැත්නම් කොන්ත්‍රාත් මට්ටමකින් අනාරක්ෂිත සේවා කොන්දේසි යටතේ තමයි මේ සේවකයින්ව සේවයට බඳවා ගනු ලබන්නේ. මෙවැනි සේවකයින්ව ආරක්ෂා කිරීම සඳහා දීර්ඝ කාලීනව වෘත්තීය සමිති ගෙන ගිය සටන් හේතු කරගෙන මේ රටේ දැනට ක්‍රියාත්මක වන නීතිරීති කිහිපයක් තිබෙනවා. මෙවැනි සේවකයින්ව ආවරණය වීම සඳහා. විශේෂයෙන්ම Shop and Office Act එක සාප්පු සහ කාර්යාල සේවක පනත යටතේ යම් සේවක කොටසක් මෙම ක්ෂේත්‍රයේ වැඩ කරන අය ඒ ගණයට වැටෙන්න තිබුණත්, සාප්පු සහ සේවක පනත යටතේ බොහෝ විට ආරක්ෂාව ලැබෙන්නේ ස්ථිර පත්වීම් පදනමේ වැඩ කරන සේවකයින් සඳහා පමණක් වෙනවා. එහෙමත් නැත්නම් රජයට ඉඩකඩ තිබෙනවා පඩි පාලක සභා හරහා, Waygesboard හරහා මෙවැනි සේවකයින්ගේ සේවා තත්ත්වය තහවුරු කරන්න, ඒ අයට කිසියම් නීතියක්, ඒ අයට වැටුප් මට්ටමක් වාගේම ඒ අයට යම් යම් සේවා කොන්දේසි ඇති කිරීමේ අවම වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. නමුත් අපට පෙනෙන්නේ නැහැ, මෙවැනි හෝටල්වල හෝ එවැනි සාප්පුවල වැඩ කරන සේවකයින්ට එවැනි සේවා සුරක්ෂිත භාවයක් ඇති කරන්න මේතාක් දුරට ක්‍රියාත්මක වෙලා තිබෙනවා කියලා. එවැන්නක් විශ්වාස කරන්න, පිළිගන්න පුළුවන් තත්ත්වයක පවතින්නේ නැහැ.

ඒක නිසා සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව හරහා ගරු සභාපතිතුමනි, අපි විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා, මෙම අදහස් ආණ්ඩුවට ඉදිරිපත් කරලා, මේ සේවකයින්ගේ සුරක්ෂිත භාවය වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් ඇති කරන්න මේ පළාත් සභාව යෝජනා කරාවිය කියලා. විශේෂයෙන්ම රජයේ සේවකයින්ගේ අවම වැටුප අද රුපියල් 12,000 ක් පමණ වන අතර, එයට ජීවන වියදම් දීමනාවත් සමග යම් වැටුපක් ලැබෙනවා. රුපියල් 20,000 කට පමණ කිට්ටු වෙන්න. නමුත් පෞද්ගලික අංශයේ සේවකයින්ට, මෙවැනි

අංශවල වැඩ කරන සේවකයින්ගේ අවම වැටුප වෙන්නේ සාමාන්‍යයෙන් රුපියල් 6000 ක් පමණ ප්‍රමාණයක්. උපරිමය වුණොත් රුපියල් 7000 ක පමණ ප්‍රමාණයට තමයි මේ අයගේ වැටුප හිමි වෙන්නේ. ඒ අයට පැය 08 සේවයේ නොවෙයි ඊට වැඩි දීර්ඝ කාලීන සේවයක් කරන්න නියම වෙනවා. ඒ වාගේම හෝටල් ක්ෂේත්‍රයේ අයට නම් යම්කිසි සහනයක් තිබෙනවා. වෙනත් ආකාරයකින් Service Charges වැනි දේ ලැබීම තුළ. නමුත් අර කුඩා කඩවල එවැනි පහසුකමක් ඒ අයට සැලසිලා ඇත්තේ නැහැ.

ඒක නිසා අපි විශ්වාස කරනවා පෞද්ගලික අංශයේ මෙවැනි තැන්වල සේවය කරන මේ සේවකයින්ට අවම වැටුපක් රජය මඟින් යෝජනා කරන්න පුළුවන් වෙනවා කියලා. ඒක නිසා අපි යෝජනා කරනවා අවම වශයෙන් රුපියල් 12,500 ක අවම වැටුපක්, මේ හෙට අනිද්දාට රටට ඉදිරිපත් කරන අයවැය ලේඛනය හරහා මේ සේවකයින්ගේ අවම වැටුප හැටියට ප්‍රකාශයට පත් කරලා එය නීත්‍යානුකූල කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම මේ අවස්ථාවේ අපි ඉදිරිපත් කරනවා. මොකද, අද ජීවන තත්ත්වයත් එක්ක, ජීවන බරත් එක්ක මිනිස්සුන්ට ජීවත් වීමේ ඉතාම අපහසු අවස්ථාවක පවතින්නේ. එදිනෙදා පාවිච්චි කරන බඩුවලටවත් බදු සහනයක් තවම නැතුව, ඒවාත් බදු සහනයකින් තොරව මිලට ගන්න සිද්ධ වෙලා තිබෙන තත්ත්වයන් තුළ මෙවැනි අඩු වැටුප් ලබන අය බොහොම අපහසුතාවයකට පත් වෙනවා. ඒ අයගේ ජීවන මට්ටමක ඉතාමත්ම පහළ මට්ටම තමයි පවත්වාගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක නිසා ඔවුන්ගේ වැටුප අවම වශයෙන් රුපියල් 12,500 කටවත් පත් කරලා මේ අයට මෙවර අයවැය මඟින් වඩාත් සහනයක් ලබා දෙන්න කටයුතු කරන්නය කියන යෝජනාව ගරු සභාපතිතුමා මඟින් අපි ආණ්ඩුවට ඉදිරිපත් කරන්න කියලා මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ ක්ෂේත්‍රවල වැඩ කරන සේවකයින් වෙනුවෙන් අපේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා වාගේ කිසියම් කාර්මික ආරවුල් පිළිබඳව වූ පනතක් යටතේ ඒ අය වෙනුවෙන් කාරක සභාවක් පත් කරලා, එහෙම නැත්නම් වෙනත් වැඩ පිළිවෙළක් ඇති කරලා මේ අයගේ අවම සේවා කොන්දේසි පිළිබඳව සොයා බැලීමක් කරලා, ඒවා පිළිබඳව ඇගයීමක් කරලා ඒ පිළිබඳව සියලු වෘත්තීය සමිතිත් සමඟ, මේ ක්ෂේත්‍රවල වැඩ කරන සේවකයින් සමඟ සාකච්ඡා කරලා ඒ අයගේ අදහසුත් ලබාගෙන ඒ අයට අවම සේවා කොන්දේසි සකස් කිරීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේ අපි අදහසක් හැටියට ඉදිරිපත් කරනවා. ඒ ආකාරයට ඉදිරිපත් කළොත් මේ සේවකයින්ට ඔවුන්ගේ ජීවිතය ඉදිරියට ගෙනියන්න, ඔවුන්ට ජීවත් වීමේ අවස්ථාව යහපත් විධියට කරගෙන යන්න තිබෙන ඉඩකඩට අපි පළාත් සභාවක් හැටියට දක්වපු අනුග්‍රහයක් හැටියට අපට විශේෂයෙන්ම සතුටු වෙන්න පුළුවන් වෙනවා කියන එක තමයි අපි කල්පනා කරන්නේ. ඒ නිසා මේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාමත්ම කාලීන සහ වැදගත් වූ යෝජනාවක් හැටියට අපි පිළිගනිමින් එම අදහස් ඔබතුමා මඟින් රජයට ඉදිරිපත් කරලා මේක රජයේ වැඩ පිළිවෙළක් යටතේ මෙම යෝජනා ක්‍රියාත්මක කරවීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභා ගර්භයේ නොමැති නිසා එතුමාගේ කාලය අහෝසි වෙනවා.

සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධ විවාදය මේ අවස්ථාවේ අවසන් වෙනවා.

***අ.භා. 12.39 ට විවාදය අවසන් විය.***
*General debate came to a close at 12.39 p.m*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුයි."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.40 ට, 2012 නොවැම්බර් මස 06 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Aaccordingly, the Provincial Council was adjourned at 12.40 p.m. till 09.30 a.m, on 06.11.2012.*